ශීර්ෂය 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 232 බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත්කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 අගෝස්තු 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත්කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ, මහභාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මහභාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) තැන්පතු

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනයෙහි ඒසීඒ - 4 ආකෘතිය අනුව 2024 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම් 08ක දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය හා භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු.16,078,508ක වෙනසක් විය.	සියලු තැන්පතු ගිණුම්වලට අදාළ ශේෂ වෙනස හඳුනාගෙන එය නිවැරදි කිරීමට 2024 නොවැම්බර් 20 දිනැතිව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත මාරුපත්‍රයක් ඉදිරිපත් කළ අතර, පසුගිය භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් හා දෙපාර්තමේන්තු පොත් සමග තැන්පත් ගිණුම් වෙන වෙනම සංසන්දනයකර ඒවායේ ශේෂ වෙනස්කම් සඳහා හේතු හඳුනාගෙන ඒ අනුව නිවැරදි කිරීම කළ යුතු බවට අංක SA/APM/01/01/32-232 හා 2024 දෙසැම්බර් 04 දිනැති ලිපියෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව හැකි ඉක්මනින් නිවැරදි කිරීම් කටයුතු කරන බව දන්වමි.	නිවැරදි තැන්පතු ගිණුම් ශේෂ මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කළ යුතු ය.

(ආ) දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සමාලෝචිත වර්ෂයේ බන්ධනාගාර ආයතනවල පවතින බන්ධනාගාර	සිගාස් පද්ධතියට ඇතුළත්කර නොමැති වාහන 48 සිගාස්	දෙපාර්තමේන්තුව සතු සියලු වත්කම්

	දෙපාර්තමේන්තු සිගාස් ගිණුම් පද්ධතියට ඇතුළත්කර නොමැති වාහන 48න් වාහන 30ක රක්ෂණය අනුව තක්සේරු වටිනාකම රු.89,680,000ක් විය. එම වාහන 48න් වාහන 35ක් ධාවනය වන අතර, වාහන 09ක් ධාවනයෙන් ඉවත්කිරීමට ද, වාහන 02ක් අලුත්වැඩියාව සඳහා යොමු කිරීමට ද, වාහන 01ක් තාවකාලිකව මාරුකිරීමට හා වාහන 01ක් අපහරණය කිරීමට ද තීරණයකර තිබුණි.	පද්ධතියට ඇතුළත් කිරීම සඳහා කටයුතු සිදුකරන බව දන්වා සිටිමි.	නිවැරදිව හඳුනාගෙන සිගාස් වැඩසටහන මගින් ගිණුම්ගත කළ යුතු ය.
(ii)	පූර්ව වර්ෂයේ (2023) දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.11,189,480,019ක් වුව ද, සමාලෝචිත වර්ෂයේ (2024) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත්කර තිබූ ඒසීඒ - 6 ආකෘතිය (එස්ඒ - 82) අනුව මූල්‍ය නොවන වත්කම්වල 2024 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය රු.10,049,873,117ක් වූයෙන් ආරම්භක ශේෂයන් අතර රු.1,139,606,902ක අඩුවීමක් පෙන්නුම් කිරීම තුළින් 2024 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයෙන් ඌණ ගණනය වී තිබුණි.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වී කඩිනමින් නිවැරදි කර ගැනීමට කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.	පූර්ව වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල ඒසීඒ - 6 ආකෘතියේ අවසාන ශේෂය හා සමාලෝචිත වර්ෂයේ ඒසීඒ - 6 ආකෘතියේ මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂය ගිණුම් ප්‍රකාශවල දක්වා ඇති ශේෂය සමග සමාන විය යුතු ය.
(iii)	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ එස්ඒ - 82 ආකෘතිය (ඒසීඒ - 6) අනුව මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂය රු.10,049,873,117ක් වුව ද, දෙපාර්තමේන්තු සිගාස් වැඩසටහන අනුව ඉදිරිපත් කරන ලද ආකෘතියේ 2024 ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂය රු.11,037,818,117ක් වීමෙන් ආරම්භක ශේෂයන් අතර රු.987,945,000ක වෙනසක් විය.	එම දෝෂය කඩිනමින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වී නිවැරදිකර ගැනීමට නියමිත ය.	මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්කර ඇති මූල්‍ය නොවන වත්කම්වල ශේෂ දෙපාර්තමේන්තු සිගාස් වැඩසටහන සමග සමාන විය යුතු ය.
(iv)	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇති එස්ඒ - 82 ආකෘතිය අනුව මූල්‍ය නොවන වත්කම්වලට ආරම්භක ශේෂවලට (ඒසීඒ - 6) කරන ලද	මෙම දෝෂය කඩිනමින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වී නිවැරදිකර ගැනීමට නියමිත ය.	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇති එස්ඒ - 82 ආකෘතිය

	එකතුකිරීම් හා දෙපාර්තමේන්තු සිගාස් වැඩසටහන අනුව මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂවලට කරන ලද එකතු කිරීම් අතර රු.987,945,000ක වෙනසක් විය.		අනුව මූල්‍ය නොවන වත්කම්වල ශේෂයන් සිගාස් වැඩසටහන සමග සමාන විය යුතු ය.
(v)	මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්කර ඇති ඒසීඒ - 6 ආකෘතියෙහි (එස්ඒ-82) වැය විෂය අංක 9151-1-1 යටතේ House Boats ලෙස රු.537,403ක ආරම්භක ශේෂයක් සඳහන්කර තිබුණු අතර, එය වැරදීමකින් ඇතුළත්කරන ලද වටිනාකමකි.	මඩකළපුව බන්ධනාගාර විසින් කාර්යාල උපකරණ යටතේ සඳහන් කළ යුතු රු.537,403ක ආරම්භක ශේෂයක් වැරදීමකින් 9151-1-1 යටතේ House Boats යටතේ සටහන්කර ඇති අතර, එය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	නිවැරදි ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්කර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.
(vi)	බන්ධනාගාර ආයතනවල ඇති ශාකවල (පොල්, තැඹිලි, කොස් ආදී) වටිනාකම් තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන ජීව විද්‍යාත්මක වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි.	බන්ධනාගාර ආයතන සතු සියලුම ගස් හා සතුන්ගේ වටිනාකම් තක්සේරුකර සිගාස් පද්ධතියට ඇතුළත් කිරීමට අදාළ කටයුතු සිදුකරන බව දන්වා සිටිමි.	බන්ධනාගාර සතු ජීව විද්‍යාත්මක වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදිව ඉදිරිපත් කළ යුතු ය.
(vii)	මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්කර ඇති ඒසීඒ - 6 ආකෘතියෙහි (එස්ඒ - 82) වැය විෂය අංක 9152-2-1 යටතේ රු.909,739,254ක අවසන් ශේෂයක් සඳහන්කර තිබුණ ද, මේ වන විටත් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් අපහරණය කරන ලද රු.5,225,000ක වටිනාකමක් සහිත වාහන 6ක පිරිවැය ද ඒ තුළ ඇතුළත්ව තිබුණි.	සිගාස් පද්ධතිය පරීක්ෂාකර මෙම මස ගිණුම් සාරාංශය මගින් එම වාහන ඉවත්කිරීමට කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.	වත්කම් ශේෂය නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.
(viii)	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ඇති ගිනිඅවිවල පිරිවැය, දුරකථන සංඥා බාධක (Jammer) පද්ධතියේ පිරිවැය සහ පිරිවැය රු.40,162,968ක් වූ බන්ධනාගාර ආයතන 23කට ලබාදී තිබෙන LGN පද්ධතිය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපළ, පිරියත හා උපකරණ යටතේ හඳුනාගෙන නොතිබීමෙන් එම වටිනාකමින් ඌණ ගණනය වී තිබුණි.	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ගිනිඅවි හා Jammer පද්ධතිය තක්සේරුකර නොමැති අතර, ඒවායේ තක්සේරු කිරීමේ කටයුතු සිදුකර සිගාස් පද්ධතියට ඇතුළත් කිරීමට හා LGN පද්ධතියේ වටිනාකම් සිගාස් පද්ධතියට කඩිනමින් ඇතුළත් කිරීමට කටයුතු සිදුකරන බවත් කාරුණිකව දන්වා සිටිමි.	වත්කම් ශේෂය නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.
(ix)	බන්ධනාගාර ආයතන 13ක අක්කර 166.7730ක් වූ ඉඩම්වල හිමිකම බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව පැවතිය ද, වටිනාකම තක්සේරු	බන්ධනාගාර ආයතන සතුව පවතින ඉඩම්වලින් ඉඩම් 13ක අක්කර 166.7730ක් වූ ඉඩම් ප්‍රමාණයක වටිනාකම ගිණුම්ගත	බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව පවතින ඉඩම්වල වටිනාකම

නොකිරීම නිසා ගිණුම්ගතකර නොතිබීමෙන් එම ඉඩම් ප්‍රමාණයේ වටිනාකමට සමාන ප්‍රමාණයකින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ශුද්ධ වත්කම් ඌණ ගණනය වී තිබුණි.	කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වී කරනු ලබන අතර, අදාළ තක්සේරු වටිනාකම් ලද පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.	තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු ය.

(ඇ) විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනුව සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත්කර තිබුණි.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති රු.170,560,476ක ලැබිය යුතු ශේෂයෙන් රු.105,181,396ක ශේෂ තහවුරුකර ගැනීමට අවශ්‍යා සාක්ෂි ඉදිරිපත් නොවී ය.	මෙම ලැබිය යුතු ශේෂය වන රු.170,560,476ක වටිනාකම 1982 වර්ෂයේ සිට 2024 දක්වා වන ලැබිය යුතු ශේෂයන් වේ. එහි 2019 - 2024 දක්වා වන ලැබිය යුතු ශේෂ පිළිබඳව විස්තර ඉදිරිපත් කර ඇති අතර, 1982 – 2015 දක්වා වන ලාභ ලැබිය යුතු ශේෂ ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් තොරතුරු නොමැත.	සම්පූර්ණ ණයගැති ශේෂ තහවුරුකර ගැනීමට අවශ්‍යා සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මකකර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
• 1.6.1 (ඇ)	පෙර වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂ අතර වෙනසක් පැවතීම.	1.6.1 (ආ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූලධන වැය විෂයයන් 05ක් සඳහා සලසාගෙන තිබූ රු.865,000,000ක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් සියයට 47කට වැඩියෙන් එනම් රු.404,185,237ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර, එම එක් එක් වැය විෂයන්හි ඉතිරිවීම සියයට 12 සිට සියයට 70ක් දක්වා පරාසයක් තුළ පැවතුණි.	ප්‍රතිපාදන ඉතිරි වී ඇති බවට එකඟ වී ඇති අතර, අදාළ වැය විෂය යටතේ වූ ඉතුරුම් සඳහා හේතු දක්වා තිබුණි.	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතු ය.
(ආ)	මූලධන වැය විෂයන් 02ක් සඳහා වෙන්කර තිබූ රු.150,000,000ක ප්‍රතිපාදනවලින් මුදල් රෙගුලාසි 66 යටතේ රු.38,000,000ක් වෙනත් වැය විෂයන් සඳහා මාරුකිරීමෙන් පසු රු.66,301,574ක් ඉතිරිව තිබූ අතර, එම වැය විෂයන්හි ශුද්ධ ප්‍රතිපාදනය මත තවදුරටත් ඉතිරිවීම් සියයට 39 සිට 74ක් දක්වා පරාසයක් තුළ පැවතුණි.	ප්‍රතිපාදන ඉතිරි වී ඇති බවට එකඟ වී ඇති අතර, අදාළ වැය විෂය යටතේ වූ ඉතුරුම් සඳහා හේතු දක්වා තිබුණි.	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතු ය.
(ඇ)	වැය විෂයන් 02ක් යටතේ සලසා තිබූ රු.6,250,000,000ක මුළු ප්‍රතිපාදනවලට අමතරව පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මගින් තවදුරටත් රු.1,548,000,000ක් ලබා දී තිබූ අතර, මෙම වැය විෂයන් සඳහා සලසා තිබූ ප්‍රතිපාදනවලින් රු.35,200,000ක් මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකිරීමට කටයුතුකර තිබීම හේතුවෙන් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන අරමුණුගත කාර්යය සඳහා වැයකර නොතිබුණි.	වැය විෂය 1203–1 වාර්ෂික ප්‍රතිපාදන වෙන්කිරීම රුපියල් මිලියන 6,200කි. පරිපූරක ඇස්තමේන්තු මගින් සලසාගත් ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 1,543කි. 1409 – 140 වැය විෂය සඳහා වාර්ෂික ප්‍රතිපාදන ඇස්තමේන්තු මගින් රුපියල් මිලියන 50ක් වන අතර, ඒ සඳහා පරිපූරක ඇස්තමේන්තු වශයෙන් රුපියල් මිලියන 5ක් ප්‍රතිපාදන සලසාගෙන ඇත.	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු සකස් කළ යුතු ය.

3.2. ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන	නිරීක්ෂණය සමග එකඟ වෙමි. 2018 අංක 19 සමාලෝචනයන් සිදුකර එහි දරන ජාතික	

	පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.	පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බව දන්වා සිටිමි.	විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ආ)	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.9 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.	බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අදාළ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම විගණකාධිපතිවරයාට අවශ්‍ය වන නිශ්චිත කාලසීමාවක් තුළ සිදුකිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරින් විසින් සහතික විය යුතු වුව ද, බොහෝ විගණන විමසුම් සඳහා බන්ධනාගාර ආයතන වෙතින් සහ අදාළ අනෙකුත් අංශ වෙතින් පිළිතුරු කැඳවා අදාළ පිළිතුරු මූලස්ථානය මගින් සාරාංශ ගතකර විගණනය වෙත ඉදිරිපත් කිරීම සිදු කරන බැවින් ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගත වේ.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

3.3 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	**වටිනාකම (රු.)**	**අනුකූල නොවීම**		
(අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහය**				
(i) XIX පරිච්ඡේදයේ 5.2.3 ඡේදය	-	මෙම ඡේදය ප්‍රකාරව සාදනිවාස සඳහා කුලියක් සෑම පදිංචි නිලධාරියෙකුගෙන්ම අයකරගත යුතු වුව ද, පොළොන්නරුව බන්ධනාගාරයේ එම නිලධාරින්ගෙන් අතීතයේ සිටම රු.30ක මුදලක් පමණක් වැටුපෙන් අයකරගෙන තිබුණි.	මෙය සාද නිවාසයක් වශයෙන් නොව නිලධාරින්ගේ බැරැක්කයක් ලෙස භාවිතා කරනු ලබන නිල නිවාසයක් වන අතර, මෙහි ස්ථිරවම රැඳී සිටින නිලධාරින් පිරිසක් නැත. මෙම ආයතනයේ සිටින නිලධාරින් අඛණ්ඩ සේවාවල නිරත වන අතර, එම නිලධාරින් ඒ අවස්ථාවල දී මෙහි ජලය සහ විදුලිය භාවිතා කරනු ලබයි. තව ද, මේ සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා කමිටුවක් පත්කර එහි නිර්දේශ ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර අවශ්‍ය කටයුතු සිදුකරන බව දැනුම් දෙමි.	සාදනිවාස සඳහා කුලිය ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.2.3 ඡේදය ප්‍රකාරව සෑම පදිංචි නිලධාරියෙකුගෙන් ම අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.
(ii) XIX පරිච්ඡේදයේ 5.8 ඡේදය	673,868	සාදනිවාස සඳහා කුලියක් සෑම පදිංචි නිලධාරියෙක්ගෙන්ම අයකරගත යුතු වුව ද, පොළොන්නරුව බන්ධනාගාරයේ එම නිලධාරින්ගෙන්	මෙය සාද නිවාසයක් වශයෙන් නොව නිලධාරින්ගේ බැරැක්කයක් ලෙස භාවිතා කරනු ලබන නිල නිවාසයක් වන අතර මෙහි ස්ථිරවම රැඳී සිටින	ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.8 ඡේදය ප්‍රකාරව ජලය හා විදුලිය සඳහා නිලධාරින් විසින් ගෙවීමට කටයුතු කළ යුතු ය.

		ජලය හා විදුලිය සඳහා යන වියදම් නිලධාරින් විසින් ගෙවිය යුතු වුව ද, 2024 වර්ෂය සඳහා මෙම සාද නිවාස වෙනුවෙන් විදුලි බිල සහ ජල බිල රජයෙන් ගෙවා තිබුණි.	නිලධාරින් පිරිසක් නැත. මෙම ආයතනයේ සිටින නිලධාරින් අඛණ්ඩ සේවාවල නිරත වන අතර, එම නිලධාරින් ඒ අවස්ථාවල දී මෙහි ජලය සහ විදුලිය භාවිතා කරනු ලබයි. තව ද, මේ සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා කමිටුවක් පත්කර එහි නිර්දේශ ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර අවශ්‍ය කටයුතු සිදුකරන බව දැනුම් දෙමි.	
(ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**				
(i) මුදල් රෙගුලාසි 104(03) ඡේදය	-	පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07කට වඩා ප්‍රමාදයක් සිදුවේ යැයි අපේක්ෂා කරන්නේ නම් නැති වීම් හා පාඩුවීම් සම්බන්ධව ප්‍රාරම්භක වාර්තාවක් වහාම එවිය යුතු ය. නමුත් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2001 වර්ෂයේ සිට 2021වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ සිදු වී ඇති අලාභ හානි 89ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 104(03) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත්කර නොතිබුණි.	මේ වන විට අනතුරක් සිදුවූ වහාම ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමටත් පූර්ණ වාර්තා කඩිනමින් මූලස්ථානයට යොමුකර ඉදිරි කටයුතු සිදුකිරීමට කටයුතු කරමින් පවතී.	මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ii) මුදල් රෙගුලාසි 104(04) ඡේදය	-	අලාභ හානි සිදු වූ දිනයේ සිට මාස 03ක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත්	මේ වන විට අනතුරක් සිදුවූ වහාම ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමටත් පූර්ණ වාර්තා	මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව කටයුතු කළ යුතුය.

			කළ යුතු ය. ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත්කර නොමැති අලාභ හානි 89කට අමතරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2000 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ සිදුවී ඇති අලාභ හානි 39ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් ඉදිරිපත්කර නොතිබුණු අතර, ඒ අනුව අලාභයන් 128කට අදාළව පූර්ණ වාර්තා ඉදිරිපත්කර නොතිබුණි.	කඩිනමින් මූලස්ථානයට යොමුකර ඉදිරි කටයුතු සිදුකිරීමට කටයුතු කරමින් පවතී.	
(iii)	මුදල් රෙගුලාසි 571 ඡේදය	10,422,854	තැන්පත් ගිණුම් 04කට අදාළ වර්ෂ 02 ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.	තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කරන බව දැනුම් දෙමි.	මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(iv)	මුදල් රෙගුලාසි 756(6) ඡේදය	-	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කමිටුවලට අදාළව සියලුම ආයතනවල පොදු 47 වාර්තාවෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කිරීම පිළිබඳ වාර්තා 2025 මැයි 20 දින වන විටත් ඉදිරිපත්කර නොතිබුණි.	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ආයතන 31ක භාණ්ඩ සමීක්ෂණ සිදුකළ යුතු වුවත්, සීමිත නිලධාරින් සංඛ්‍යාවක් මගින් භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකළ යුතු බැවින්, භාණ්ඩ සමීක්ෂණ කටයුතුවල යම් ප්‍රමාදයක් දක්නට ලැබෙන අතර, අදාළ කාලපරිච්ඡේදය තුළ සියලු ආයතනයන්හි භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකිරීමට හැකි සෑම උත්සාහයක්ම දරනු ඇත.	මුදල් රෙගුලාසි 756(6) ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

(v)	මුදල් රෙගුලාසි 1647(ඉ) ඡේදය	-	වාහන භාර නිලධාරීන් විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන පිළිබඳව ඒ ඒ වාහනයේ වර්ගය හා මෝස්තරය ද, ලියාපදිංචි කිරීමේ අංකය ද, තමන්ට භාරදුන් දිනය ද, පැවරූ දිනය හා ඒ පිළිබඳ විස්තර ද වෙනත් නිසි තොරතුරු ද දැක්වෙන ලැයිස්තුවක් තබාගත යුතු වුවත්, බන්ධනාගාර ආයතන 05ක් 2024 දෙසැම්බර් 31 දින වන විට එපරිදි කටයුතුකර නොතිබුණි.	වාහන සම්බන්ධයෙන් සියලු විස්තර ඇතුළත් ලැයිස්තුවක් තබාගන්නා ලෙස අදාළ ආයතන දැනුවත් කරන ලදී.	මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	-	සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12ක කාල සීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, 2024 දෙසැම්බර් 31 දින වන විට බන්ධනාගාර ආයතන 12ක වාහන 122ක් එපරිදි කටයුතුකර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් සොයාබලා අවශ්‍යකටයුතු සිදුකිරීමට අදාළ ආයතන දැනුවත් කරන බව දන්වා සිටිමි.	අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

(ඇ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මුදල් රෙගුලාසි 371(5) ඡේදය	-	අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන්කර දින 10ක් තුළ අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුව ද, එපරිදි පියවා නොතිබීම නිසා බන්ධනාගාර මූලස්ථානයේ අවස්ථා 26කදී ලබාගත් රු.977,630ක අත්තිකාරම් මුදල්වලට අදාළව රු.77,938ක මුදලක් දින 11ත් 52ත් අතර කාලයක් තුළ අදාළ නිලධාරියා සතුව පැවතුණි.	අතුරු අග්‍රිම ලබාගන්නා කාර්යය නිමවූ විගස අත්තිකාරම් පියවන ලෙස නිලධාරින් දැනුවත්කර ඇත.	මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව ලබාගත් අත්තිකාරම් කඩිනමින් පියවීමට කටයුතු කළ යුතු ය.
(ඉ)	2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4 හා 6 වන ඡේද	1,389,791	2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම / මරණ පාරිතෝෂිතය ලබාදී ඇති නිලධාරින්ගෙන් අයවිය යුතුව තිබුණු ණයශේෂයන් තම ආයතනවල අත්තිකාරම් "බී" ගිණුමේ ඇතුළත් නොවීමට ආයතන ප්‍රධානීන් වග බලාගත යුතු වුවත්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂය වන රු.2,285,609ක ප්‍රමාණයෙන් සියයට 61ක ප්‍රමාණයක් වසරකට වඩා වැඩි ශේෂයන් විය.	දෙපාර්තමේන්තුවේ හිඟ ණයශේෂ විශාල ප්‍රමාණයක් (බන්ධනාගාර ආයතන 31ක පවතින) මේ වන විට අයකර ගැනීමට හැකි උපරිම උත්සාහයන් දරා ඇති අතර, ඉදිරියේ දී එම හිඟ ණය අවමකර ගැනීමට ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගනු ඇත.	අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ඊ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ	-	දැන්වීම් පළකිරීම ආර්ථික වශයෙන් අවාසි සහගත වන	ඉදිරියේ දී නියමිත මාර්ගෝපදේශ පරිදි කටයුතු සිදුකිරීමට අදාළ	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව

3.4.3 (ආ) ඡේදය		අඩු වටිනාකමකින් යුත් අයිතමයන් ප්‍රසම්පාදනය කිරීම සඳහා හෝ නිතර භාවිතා කරනු ලබන අයිතමයන් මිලදීගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම කළ යුතු අතරම, මෙම ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් මෝටර් වාහන අලුත්වැඩියා කිරීම වැනි විශේෂ වර්ගවල භාණ්ඩ සහ සේවා සැපයීමට හැකි සැපයුම්කරුවන්ගේ නම් ඇතුළත් ලැයිස්තුවක් පිළියෙල කරනු ලැබිය යුතු නමුත්, 2024 දෙසැම්බර් 31 දින වන විට බන්ධනාගාර ආයතන 20ක ගරාජ් සහ සේවා සැපයුම්කරුවන් ලියාපදිංචිකර නොතිබුණි.	ආයතන දැනුවත් කරන බව දන්වා සිටිමි.	කටයුතු කළ යුතු ය.
(උ) **දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර චක්‍රලේඛ**				
(i) 1992 ජුනි මස 08 දිනැති අංක 20/92 සහ 2022 නොවැම්බර් 08 දිනැති අංක කේ.01/විදේශ කටයුතු/2022	-	විදේශ ජාතිකයෙකු බන්ධනාගාරගත කිරීමෙන් පසුව ඊට අදාළ වාර්තාවක් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් සහ එහි පිටපත් එම පුද්ගලයා (සිරකරු) අයත් වන රටේ තානාපති කාර්යාලයට සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත යැවීමට	ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වමි.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

			කටයුතු කළ යුතු වුවත්, සිරකරුවන් 26ක් සම්බන්ධයෙන් අදාළ වාර්තාවන් සමග දැනුවත් කිරීම් සිදුකළ බවට ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.		
(ii)	බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග 511 හා 222 ඡේද	-	මෙම ව්‍යවස්ථාපිත බන්ධනාගාර නීතියෙහි ද සඳහන් පරිදි බන්ධනාගාර ගත රැඳවියන් සඳහා දෛනිකව ආහාර ලබාදීමේ දී එක් රැඳවියෙකු සඳහා නිකුත්කරන අමු හා වියළි සලාක ප්‍රමාණය, එක් සම්මත ප්‍රමාණයක් විය යුතු වුවත්, එක් එක් බන්ධනාගාර ආයතනවල එම ප්‍රමාණයන් විවිධ අගයන්ගෙන තිබුණි.	මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු සිදුකිරීමට අදාළ ආයතන දැනුවත් කරන බව දන්වා සිටිමි.	බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

3.4 තැන්පත් ශේෂයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අංක 6000-0-0-006-0-081 දරන තැන්පත් ගිණුමේ 2024 දෙසැම්බර් 31 දිනට රු.3,722,705ක ශේෂයක් පැවතුණු අතර, මෙම තැන්පතු සිරකරුවන්ගේ පුද්ගලික බැංකු ගිණුමට බැරකිරීමට අදාළ මුදල් වන අතර, මෙම ශේෂයෙන් සියයට 45ක් එනම් රු.1,675,808ක ප්‍රමාණයක තැන්පතු වසර 02කට අධික කාලයක් පොදු තැන්පත් ගිණුමේ පැවතුණි.	සිරවේතන හිමි සිරකරුවන්ට අදාළ බැංකු ගිණුම් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර, කඩිනමින් අදාළ ගිණුම් විවෘතකර එම සිරවේතන අදාළ සිරකරුවන්ගේ බැංකු ගිණුම්වලට බැරකිරීමට කටයුතු කරන බව විගණනය වෙත කාරුණිකව දැනුම් දෙමි.	සිරවේතන සිරකරුවන්ගේ පුද්ගලික බැංකු ගිණුමට කාල පමාවකින් තොරව බැරකිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	අංක 6000-0-0-1-16 දරන තැන්පත් ගිණුමේ 2024 දෙසැම්බර් 31 දිනට රු.6,860,070ක ශේෂයක් පැවතුණු අතර, මෙම තැන්පතු ඇප තැන්පත් තැබිය යුතු නිලධාරින්ගේ වැටුපෙන්	ඇප තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 885 ප්‍රකාරව විධිමත් පරිදි කටයුතු කිරීමටත්, ගිණුම් විවෘත නොකළ නිලධාරින් වෙනුවෙන් කඩිනමින් ගිණුම් විවෘත කිරීමට	මුදල් රෙගුලාසි 885 ප්‍රකාරව කඩිනමින් කටයුතු කළ යුතු ය.

අයකරනු ලබන ඇප මුදල් එම නිලධාරින්ගේ බැංකු ගිණුම් විවෘත කරන තෙක් රඳවාගන්නා මුදල් වන අතර, මුදල් රෙගුලාසි 885 ප්‍රකාරව විධිමත් පරිදි කටයුතු නොකර ඇති බැවින් මෙම ශේෂයෙන් සියයට 21ක් එනම් රු.1,418,010ක ප්‍රමාණයක් තැන්පතු වසර 02 කට අධික කාලයක් තුළ පොදු තැන්පතු ගිණුමේ පැවතුණි.	අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසත් සියලුම ආයතනවල බන්ධනාගාර අධිකාරීවරුන්ට උපදෙස් ලබාදීමට කටයුතුකර ඇති බව විගණනය වෙත දන්වමි.	

4. මෙහෙයුම්සමාලෝචනය

4.1 දැක්ම හා මෙහෙවර

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
කාලීන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි රැඳවියන් පුනරුත්ථාපනයකර යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමට අවශ්‍ය සමාජ පසුබිම සැකසීම බන්ධනාගාරයේ ප්‍රධාන කාර්යයක් වන අතර, එහි දී අධ්‍යාපනය, කාර්යයක නිරතවීම වැනි අර්ථවත් ක්‍රියාකාරකම් සහ වෙනත් වැඩසටහන් වෙත රැඳවියන් යොමුකිරීම හා සාධනීය බන්ධනාගාර පරිසරයක් නිර්මාණයකර රැඳවියන්ගේ ශක්තිය නිර්මාණාත්මක වෘත්තීන් වෙත යොමුකිරීමෙන් පසුව සමාජගත කිරීම සඳහා සූදානම් කිරීමට සහායවීමක් ඇතිවන පරිදි පුනරුත්ථාපන කටයුතු පවත්වාගෙන යා යුතු වුව ද, බන්ධනාගාර තදබදය හමුවේ රැඳවියන් විධිමත් පරිදි පුනරුත්ථාපනය නොවුණි.	බන්ධනාගාර තදබදය දෙපාර්තමේන්තුවට විශාල අභියෝගයක් වී ඇති අතර, වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය ස්ථාපනය කිරීම, වටරැක බන්ධනාගාරයේ තාප්පය හා රැඳවි ගොඩනැගිල්ලක් ඉදිකිරීම්, වාරියපොල බන්ධනාගාරය පුළුල් කිරීම, පල්ලේකැලේ බන්ධනාගරයේ රැඳවි ගොඩනැගිලි ඉදිකිරීම, කළුතර බන්ධනාගාරයේ ගොඩනැගිලි ඉදිකිරීම ආදී ව්‍යාපෘති මගින් බන්ධනාගාරයේ ධාරිතාවය ඉහළ නැංවීම පිණිස වූ ක්‍රියාමාර්ග ගනිමින් පවතින අතර, 2025 වසර සඳහා අයවැය යටතේ බන්ධනගාර රැඳවියන්ගේ වෘත්තීය කුසලතා වැඩිදියුණු කිරීම වෙනුවෙන් වූ රුපියල් මිලියන 100ක ප්‍රතිපාදනය යොදාගනිමින් රැඳවියන් විධිමත් පුනරුත්ථාපනයකට සැලසුම් සකසා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම පිණිස ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.	බන්ධනාගාර රැඳවියන් විධිමත් පරිදි පුනරුත්ථාපනය කිරීමට කටයුතු කළ යුතු ය.

4.2 සැලසුම් කිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරී සැලැස්ම සකස්කිරීමේ දී වර්ෂය තුළ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්ට අදාළව සත්‍ය ක්‍රියාකාරකම් හඳුනාගෙන ප්‍රතිපාදන තක්සේරුකර ක්‍රියාකාරී සැලැස්ම සකස්කර තිබුණි. විධිමත් අනුමැතිය ලද ක්‍රියාකාරී සැලැස්ම නිරන්තරයෙන් සංශෝධනයකර අනුමතකර තිබූ නිසා, අස්ථිත්වය විසින් සිදුකරනු ලබන සියලුම කාර්යයන් (භාණ්ඩ, සේවා හා ව්‍යාපෘති) පූර්ණය කිරීමට යොදාගන්නා කළමනාකරණ මෙවලමක් වශයෙන් උපයෝගීකර ගැනීමට නොහැකිව තිබුණු අතර, සකසුරුවමින්, කාර්යක්ෂමව හා ඵලදායී පරිදි කාලානුරූපී ආකාරයට සැලසුම් සම්පාදනය කිරීමේ අපේක්ෂිත අරමුණු කරා ළඟාවීමට ද නොහැකි වී තිබුණි.	වසර ආරම්භයේ දී අවශ්‍යතාවය අනුව හඳුනාගනු ලබන ක්‍රියාකාරකම් පසුව සීමිත ප්‍රතිපාදනවලට ගැළපෙන පරිදි ප්‍රමුඛතාවය අනුව යළිගැළපුම් කිරීම අවශ්‍ය වේ. සීමිත වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණයක් තුළින් දිවයින පුරා වූ ආයතනවල ගැටලු විසඳීම සඳහා යොදාගන්නා සරල උපක්‍රමික කළමනාකරණ මෙවලමක් ලෙස මෙහි දී ක්‍රියාකාරී සැලැස්ම භාවිතාකර ඇත.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු ය.

4.3 කාර්යභාරයන් ඉටුනොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 නොවැම්බර් 30 දිනට සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව එක් එක් ප්‍රාග්ධන වැය විෂයන් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය හා 2024 වර්ෂය තුළ සිදුකරන ලද ප්‍රාග්ධන වියදම පරීක්ෂාවේ දී වෙන්කිරීම් ඌණ උපයෝජිතව තිබූ අවස්ථා 05ක් පැවතුණි.	වෙන්කරන ලද ප්‍රතිපාදනවලින් ඉතිරිවීම් ප්‍රතිශතය ඌණ උපයෝජිතව බලපා ඇති හේතු පිළිබඳ වර්තමාන තත්ත්වය පැහැදිළිකර තිබුණි.	වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රශස්ථ ලෙස යොදා ගැනීමට කටයුතු කළ යුතු ය.
(ආ)	2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ප්‍රාග්ධන වැය විෂයන්හි සැලසුම් කරන ලද ක්‍රියාකාරකම්/ ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය පරීක්ෂාවේ දී කාර්යසාධනය සියයට 0ක් වූ අවස්ථා 13ක් ද, සියයට 50කටත් වඩා අඩුව පැවති අවස්ථා 03ක් ද පැවතුණි.	මූල්‍ය කාර්යසාධනයක් නොමැතිවීමට බලපෑ හේතු හා වර්තමාන තත්ත්වය පැහැදිළිකර තිබුණි.	වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රශස්ථ ලෙස යොදා ගැනීමට කටයුතු කළ යුතු ය.

4.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වැය විෂය 2102 යටතේ මාංචු මිලදී ගැනීම සඳහා රු.5,850,000ක් වෙන්කර තිබූ අතර, 2024 නොවැම්බර් මස සංශෝධනයට අනුව රු.5,805,600ක් වෙන්කර තිබුණි. එහෙත් එම මුදල් එම කාර්යය සඳහා උපයෝජනය නොකර වෙනත් කාර්යාල උපකරණ මිලදීගැනීම වෙනුවෙන් යොදවා තිබුණි.	බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත වෙන්වන ඉතා සීමිත ප්‍රතිපාදන ප්‍රමාණය විචක්ෂණශීලීව කළමනාකරණය කරමින් ඌණ උපයෝජනය වැළැක්වීම පිණිස බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය මත දෙපාර්තමේන්තුව වෙත මිලදීගත යුතු වෙනත් අත්‍යාවශ්‍ය භාණ්ඩ මිලදීගැනීමක් සිදුකර ඇත.	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු තාත්විකව සකස්කර ඉදිරිපත් කළ යුතු වේ.
(ආ)	වැය විෂය 2102 යටතේ මාධ්‍ය අංශයේ උපකරණ මිලදීගැනීම වෙනුවෙන් මූලික තක්සේරුව ලෙස රු.3,750,000ක් වෙන්කර තිබූ අතර, එය නොවැම්බර් 30 සංශෝධනයෙන් රු.5,305,870ක් ලෙස වැඩිකර ගෙන තිබුණි. එහෙත් එම මුදල් අදාළ උපකරණ වෙනුවෙන් උපයෝජනය කරගෙන නොතිබුණි.	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයට සරිලන ලංසු ඉදිරිපත් නොවීම මත දෙවතාවක් මිලගණන් කැඳවා ඇත. මේ වන විට භාණ්ඩ මිලදීගෙන ගෙවීම් කිරීමට නියමිතව ඇත.	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු තාත්විකව සකස්කර ඉදිරිපත් කළ යුතු වේ.

4.5. අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබානොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පාර්සල් සහ බොඩි ස්කැනර් යන්ත්‍ර මිලදීගැනීම		
	(i) බන්ධනාගාර ආයතන 09ක් සඳහා පාර්සල් ස්කැනර් මැෂින් 06ක් සහ බොඩි ස්කැනර් මැෂින් 04ක් රු.123,762,00ක මුදලක් වැයකර මිලදීගත් දින සිට 2024 වර්ෂය දක්වා අලුත්වැඩියා කටයුතු හා නඩත්තු කටයුතු සඳහා රු.140,108,489ක වියදමක් දරා තිබුණ ද, 2024 දෙසැම්බර් 31 දිනය වන විටත් ආයතන 08ක පාර්සල් ස්කැනර් යන්ත්‍ර 04ක් සහ බොඩි ස්කැනර් යන්ත්‍ර 04ක් වසර 04ත් මාස 04ත් අතර කාලයක සිට අක්‍රියව පැවතුණ	මේ වන විට බොහෝ යන්ත්‍ර නිසි ක්‍රමවේදයන් යටතේ අලුත්වැඩියා කටයුතු සිදුකර භාවිතා කරනු ලැබේ.	තහනම් ද්‍රව්‍ය බන්ධනාගාරය තුළට රැගෙන ඒම වැළැක්වීම සඳහා පාර්සල් සහ බොඩි ස්කැනර් යන්ත්‍ර ක්‍රියාකාරී මට්ටමේ පවත්වාගත යුතු අතර, ඒවා කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු ය.

(ii)	කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය සතු බොඩි ස්කෑනර් යන්ත්‍රයේ අලුත්වැඩියාව සඳහා එහි දේශීය නියෝජිත ආයතනය විසින් 2020 සැප්තැම්බර් 04 වන දින රු.4,832,460ක ඇස්තමේන්තුවක් ලබාදී තිබූ අතර, 2022 ජුනි 09, 2023 මාර්තු 13 හා 2023 ජුලි 11 යන දිනයන්වල දී සේවා/ කාර්මික ශිල්පීන් පැමිණ බොඩි ස්කෑනර් යන්ත්‍රයේ කොටස් අලුත්වැඩියාව සඳහා ආයතනය වෙත රැගෙන ගොස් ඇති අතර, එම රැගෙන ගිය කොටස් නැවත කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය වෙත භාර දී නොතිබුණු බවත්, විගණිත දිනය වන විටත් මෙම යන්ත්‍රයේ රාමුව හා පිටත ආවරණය පමණක් කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය තුළ පැවතුණි.	යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා මේ වන විට කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ බොඩි ස්කෑනර් යන්ත්‍රයේ අවශ්‍ය කොටස් ගෙන්වීමට අදාළ ආයතනවලින් මිල ගණන් කැඳවා ඇත.	තහනම් ද්‍රව්‍ය බන්ධනාගාරය තුළට රැගෙන ඒම වැළැක්වීම සඳහා පාර්සල් සහ බොඩි ස්කෑනර් යන්ත්‍ර ක්‍රියාකාරී මට්ටමේ පවත්වාගත යුතු අතර, ඒවා කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු ය.
(iii)	පාර්සල් සහ බොඩි ස්කෑනර් යන්ත්‍ර සේවා කිරීම සම්බන්ධව සේවා ගිවිසුම යාවත්කාලීන කිරීමට කටයුතුකර නොතිබුණි. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ කාර්මික X - කිරණ යන්ත්‍ර භාවිතය / ළඟ තබාගැනීම වෙනුවෙන් අන්තර්කාල බලපත්‍ර ලබාගැනීම සඳහා මෙම යන්ත්‍ර ක්‍රමාංකනය (Calibration) කර තිබීම අවශ්‍යතාවයක් වන බව නිරීක්ෂණය වූ අතර, මෙම යන්ත්‍ර සියල්ලම ක්‍රමාංකනය (Calibration) කිරීම, පෙර පැවති සේවා ගිවිසුමට අනුව පුද්ගලික සමාගම විසින් සිදුකරනු ලබන බැවින්, මෙලෙස සේවා ගිවිසුමට එළැඹ නොවීමෙන් මෙම අවශ්‍යතාවය සපුරාගැනීමට නොහැකි වී තිබුණි. මුදල් රෙගුලාසි 802(2) ප්‍රකාරව යන්ත්‍ර පිළිබඳ වගකීම් දරන නිලධාරීන් විසින් යන්ත්‍රවල භාරය, පාවිච්චිය හා නඩත්තුව යන කාර්යයන් විවිධ වූ පරිදි පරිපාලනය කළ යුතුවාක් මෙන් එම කාර්යයන්හි දී විධිමත් සැලකිල්ලක් ද දැක්විය යුතුව පැවතුණි.	2023 වර්ෂයේ දී පැවති යන්ත්‍ර තුළින් බහුතරයක් අලුත්වැඩියා තත්ත්වයේ පැවති බැවින් සේවා ගිවිසුම්ගත වීම සිදුනොකළ අතර, මෙම වර්ෂය තුළ අදාළ යන්ත්‍ර අලුත්වැඩියාවෙන් පසු නැවත ගිවිසුම්ගතවීම සිදුකරනු ලබයි. එමෙන්ම සේවා ගිවිසුම්ගත වීම සඳහා සේවා ගිවිසුම්පත් ලබා ගැනීමට සේවා නියෝජිත ආයතනය දැනුවත්කර ඇති බව ද කාරුණිකව දන්වමි. මෙම යන්ත්‍ර ක්‍රියාකරවීම නඩත්තු සේවා කටයුතු සඳහා විධිමත් පුහුණුවීම්ලත් හා ඒ සඳහා පමණක් අනුයුක්ත කරන ලද නිලධාරීන් එම යන්ත්‍ර පවතින සියලු ආයතනවල නොමැති අතර, අලුත්වැඩියා පිළිබඳ ගොනු පවත්වාගෙන යනු ලබයි. ඉදිරියේ දී සෑම ආයතනයකම පවතින පාර්සල් හා බොඩි ස්කෑනර් යන්ත්‍ර සඳහා වෙනම ලොග් සටහන් පොතක් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලබයි.	තහනම් ද්‍රව්‍ය බන්ධනාගාරය තුළට රැගෙන ඒම වැළැක්වීම සඳහා පාර්සල් සහ බොඩි ස්කෑනර් යන්ත්‍ර ක්‍රියාකාරී මට්ටමේ පවත්වාගත යුතු අතර, ඒවා කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු ය.
(iv)	මෙම යන්ත්‍ර සැපයුම් ආයතනය විසින් පාර්සල් පරීක්ෂා කිරීමේ උපකරණ පරීක්ෂාව හා බොඩි ස්කෑනර් උපකරණ පරීක්ෂාව	මේ සම්බන්ධයෙන් සොයාබලා අවශ්‍ය කටයුතු කිරීමට නියමිත ය.	තහනම් ද්‍රව්‍ය බන්ධනාගාරය තුළට රැගෙන ඒම

	සඳහා 2014 වර්ෂයේ දී නිලධාරින් 12 දෙනෙකු ඇමෙරිකා එක්සත් ජනපදය සහ නෙදර්ලන්තයේ විදේශ පුහුණුවක් ලබාදීමට කටයුතුකර තිබුණ ද, එම නිලධාරින් වෙනත් අංශවල සේවයේ යෙදී සිටීම නිසා මෙම යන්ත්‍රවල ක්‍රියාකාරීත්වය සඳහා සුවිශේෂී දායකත්වයක් ලබා දී නොතිබුණි.		වැළැක්වීම සඳහා පාර්සල් සහ බොඩි ස්කෑනර් යන්ත්‍ර ක්‍රියාකාරී මට්ටමේ පවත්වාගත යුතු අතර, ඒවා කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජන ආයතනය (ICTA) විසින් රු.40,162,968ක් වටිනා ලංකා රාජ්‍ය අන්තර්ජාල පහසුකම් (LGN) 2023 වර්ෂයේ දී බන්ධනාගාර ආයතන 23ක් වෙත පරිත්‍යාග වශයෙන් ලබා දී තිබූ අතර, බන්ධනාගාර ආයතනවල එම සම්බන්ධතාවයට අදාළ මාසික අන්තර්ජාල සේවා වියදම් ද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය විසින් දරනු ලබයි. බන්ධනාගාර ආයතනවල පවතින ලංකා රාජ්‍ය අන්තර්ජාල (LGN) සම්බන්ධතාවයේ දෝෂ නැවත අලුත්වැඩියාකර භාවිතා කිරීමේ සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය වූ අතර, එමනිසා වඩා කාර්යක්ෂම සේවාවක් ලබාගැනීමේ අවම හැකියාවක් පැවතුණි. සීමාරහිත අඛණ්ඩ සැපයුමක් (Unlimited) ලබා දී තිබිය දී ලංකා රාජ්‍ය අන්තර්ජාල (LGN) සම්බන්ධතාවයට අමතරව නියැදි පරීක්ෂාවක් අනුව 2024 වර්ෂය වෙනුවෙන් රු.1,146,690ක් වටිනා අන්තර්ජාල පහසුකම් බන්ධනාගාර ආයතන 13ක් විසින් වෙනත් සැපයුම්කාර ආයතන වෙතින් ලබාගෙන තිබුණි.	රාජ්‍ය තොරතුරු ජාලයේ ඇතිවන නිරන්තර බිඳවැටීම් හමුවේ බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතියේ අඛණ්ඩතාවය සහතික කරලීම පිණිස විකල්ප අන්තර්ජාල සැපයුමක් තබාගැනීමට සිදු වී ඇත. ඒ අනුව 2024 වසරේ සියලුම ආයතන වෙත විකල්ප අන්තර්ජාල සැපයුමක් ලබාගන්නා ලෙස දෙපාර්තමේන්තුවෙන් ලබාදුන් උපදෙස් මත මෙලෙස ආයතන 13ක් එම වියදම් දරා ඇත. බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය දිවයින පුරා ආයතන 28ක ක්‍රියාත්මක අතර, එක් ආයතනයක සිදුවන අන්තර්ජාල බිඳවැටීමක් සමස්ථ දත්ත පද්ධතියේම නිරවද්‍යතාවයට බලපාන බැවින් මෙම ක්‍රියාමාර්ගය ගෙන ඇත.	LGN පද්ධතියෙන් ප්‍රශස්ථ සේවාවක් ලබාගැනීමට කටයුතු කළ යුතු ය.

4.6 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වැලිකඩ බන්ධනාගාරයේ 63/1 සිට 63/8 දක්වා නිවාස අලුත්වැඩියා කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව 2023 නොවැම්බර් 14 දින පුද්ගලික ආයතනයක් වෙත රු.33,130,441ක මුළු වටිනාකමකට ප්‍රදානය කිරීමට ප්‍රසම්පාදන අනුමැතිය ලැබී තිබූ අතර, මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන්කර 2024 ජූලි 09 දින බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත නැවත භාර දී තිබූ අතර, එහි රජයේ නිවාස 08ක් නිලධාරීන් වෙත ලබා දී තිබූ බවත්, අලුත්වැඩියා කටයුතු විධිමත්ව සිදුනොවීම නිසා නැවත අලුත්වැඩියා කළ යුතු කාර්යයන් මෙම වාර්තාව දින දක්වා සිදුකර නොතිබුණි.	මේ වන විට අලුත්වැඩියා කටයුතු සිදුකරමින් පවතින බව දන්වා සිටිමි.	ඉදිකිරීම් කටයුතු විධිමත්ව සිදු කිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	කෑගල්ල බන්ධනාගාරයේ මායිම් තාප්පය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.16,568,824ක (වැට් රහිත) වටිනාකමකට අදාළ කොන්ත්‍රාත්කරු වෙත 2024 මැයි 25 දින ප්‍රදානයකර තිබූ අතර, ඉදිකිරීම් පරීක්ෂාවේ දී 2024 නොවැම්බර් 18 දිනට තිබිය යුතු භෞතික ප්‍රගතිය සියයට 90.3ක් වුව ද, එදිනට සත්‍ය භෞතික ප්‍රගතිය සියයට 2ක් වී තිබුණි. ඉදිකිරීම් කොන්ත්‍රාත් සමාගමේ දුර්වලතා හේතුවෙන් ව්‍යාපෘතිය ඉදිකිරීම ප්‍රමාදවී පැවතුණු අතර, මෙම මායිම් තාප්පයේ අලුත්වැඩියාව කරන ස්ථානයට ආසන්නව මීටර් 10ක් ඇතුළත තවත් ස්ථාන දෙකකින් පුපුරායාම් 02ක් පමණ නිරීක්ෂණය වන අතර, එය අනාගතයේ දී යළි අනතුරක් ඇතිවිය හැකි තත්ත්වයක් විය.	NBRO ආයතනයේ අනුමැතිය ලබාගැනීමෙන් පසුව අදාළ පිළිසකර කිරීමේ කටයුතු සිදු කිරීමට නියමිත බව දන්වා සිටිමි.	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පූර්ණ උපදෙස් පරිදි ඉදිකිරීම් කටයුතු කිරීමට පියවරගත යුතු ය.
(ඇ)	2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත්කර නොමැති ප්‍රාග්ධන වැය විෂයන් 03කට අදාළ ක්‍රියාකාරකම් 09ක් සඳහා රු.61,419,696 ක් වැයකර තිබුණි. 2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් එහෙත්	නිරීක්ෂණය සමග එකඟ වේ. ප්‍රාග්ධන වැය විෂයන් ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවීමට හේතු විස්තරාත්මකව දක්වා තිබුණි.	සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව කටයුතු කළ යුතු ය.

සමාලෝචිත වර්ෂය තුළ සිදුකිරීමට අපොහොසත් වී ඇති ප්‍රාග්ධන වැය විෂයන් 03කට අදාළ ක්‍රියාකාරකම් 07ක් වූ අතර ඒ සඳහා රු.27,800,000ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණි.

4.7. වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බන්ධනාගාර ආයතනවල කර්මාන්ත අංශයන්හි ඌණ උපයෝජිතව පවතින යන්ත්‍ර සහ උපකරණවල තොරතුරු පරීක්ෂාවේ දී බන්ධනාගාර ආයතන 06ක යන්ත්‍ර/උපකරණ 21ක් ඌණ උපයෝජිතව පවතින බව හෙළිදරව් වූ අතර, එම යන්ත්‍ර/උපකරණ අලුත්වැඩියා කිරීමට හෝ ප්‍රශස්ථව භාවිතා කිරීමට හැකි බන්ධනාගාර ආයතනවලට ලබාදීමට හෝ කටයුතුකර නිෂ්පාදන ක්‍රියාවලියට දායකකර ගැනීමට පියවරගෙන නොතිබුණි.	මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ඉදිරියේ දී සිදුකිරීමට නියමිත බව දන්වා සිටිමි.	ඌණ උපයෝජිත වත්කම් පූර්ණ ධාරිතාවයෙන් භාවිතා කිරීමට විධිමත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතු ය.
(ආ)	බන්ධනාගාර කර්මාන්ත අංශයන්වල අක්‍රීයව පවතින යන්ත්‍ර සහ උපකරණ පිළිබඳව තොරතුරු පරීක්ෂාවේ දී බන්ධනාගාර ආයතන 08ක යන්ත්‍ර සහ උපකරණ 50ක් අක්‍රීයව පවතින බවත්, එහි යන්ත්‍ර සහ උපකරණ 04ක් අලුත්වැඩියාව කළ හැකි වුව ද, ඒ සඳහා විධිමත් පියවරගෙන නොතිබුණු බවත්, අපහරණය කළ යුතු යන්ත්‍ර අපහරණය කිරීමට අවශ්‍ය විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත් හෙළිදරව් විය.	මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ඉදිරියේ දී සිදුකිරීමට නියමිත බව දන්වා සිටිමි.	අක්‍රීයව පවතින හා අපහරණය කළ යුතු වත්කම් සම්බන්ධව විධිමත් පරිදි කටයුතු කළ යුතු ය.
(ඇ)	පොළොන්නරුව, අගුණකොළපැලැස්ස, මහර, පල්ලෙකැලේ එළිමහන් සිරකඳවුර, බෝගම්බර, වටරැක, බූස්ස, වීරවිල, දළුපත, කළුතර, යාපනය, මඩකළපුව, පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය හා වැලිකඩ යන	මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි.	භාවිතා කරනු ලබන වාහනවල වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කළ යුතු ය.

	බන්ධනාගාර ආයතන 14 විසින් 2024 දෙසැම්බර් 31 දිනට භාවිතා කරනු ලබන වාහන 39ක වටිනාකම තක්සේරුකර නොතිබුණි.		
(ඇ)	මුදල් රෙගුලාසි 802 ප්‍රකාරව වාහන පහසුකම් සපයනු ලබන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඒවා පමණට වැඩි නොවන බව හා නිෂ්කාර්යව නොතිබෙන බවටත් වගබලා ගැනීමට පියවරගත යුතු වුව ද, බන්ධනාගාර ආයතන 15ක වාහන 29ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් භාවිතයෙන් ඉවත්කර තිබුණි.	මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි.	මුදල් රෙගුලාසි 802 ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ඉ)	බන්ධනාගාර ආයතන 21ක් සතුව පවතින භාවිතයටගත නොහැකිව අපහරණය සඳහා නිර්දේශ වී අවුරුදු 05ක කාලයක් ගත වී ඇතත්, 2024 දෙසැම්බර් 31 දින වන විටත් අපහරණ කටයුතු සිදුකර නොතිබෙන වාහන 33ක් පැවතුණි.	මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි.	අපහරණ කටයුතු විධිමත් පරිදි සිදු කිරීමට කටයුතු කළ යුතු ය.
(ඊ)	බන්ධනාගාර ආයතන 31කට අදාළව එහි නිලධාරීන්ට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධව යටිතල පහසුකම් අවශ්‍යතා 286ක ප්‍රමාණයක් 2024 දෙසැම්බර් 31 දින වන විට හඳුනාගෙන ඇති නමුත්, ඒවා ක්‍රියාත්මක කිරීමට හා සංවර්ධනය කිරීමට විධිමත් පරිදි කටයුතුකර නොතිබුණි.	හඳුනාගන්නා ලද බන්ධනාගාර ආයතනවල සංවර්ධනය කළ යුතු කාර්යයන් ලැබෙන සීමිත ප්‍රතිපාදන නිසිපරිදි කළමනාකරණයකර ගනිමින්, ප්‍රමුඛතාව අනුව ඉටුකිරීමට කටයුතු කිරීම.	නිලධාරීන්ට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතු ය.
(උ)	පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව හා ජාතික නීති පද්ධති, රෙගුලාසි හෝ වෙනත් මාර්ගෝපදේශ පදනම්කර ගත් ප්‍රමිතීන්ට අනුකූලව මානසික හා ශාරීරික යෝග්‍යතාවයට ගැළපෙන ආකාරයට ඉඩපහසුකම් සහිතව යම් බන්ධනාගාරයක රැඳවියෙකු රැඳවිය යුතු වුව ද, බන්ධනාගාර ආයතන 31ක නේවාසිකයන්ට අදාළව අවශ්‍ය යටිතල පහසුකම් අවශ්‍යතා 228ක ප්‍රමාණයක් හඳුනාගෙන ඇති නමුත්, ඒවා ක්‍රියාත්මක කිරීමට හා සංවර්ධනය කිරීමට විධිමත් පරිදි කටයුතුකර නොතිබුණු බවත්, ඒවා අතරින් වැඩිම නේවාසික යටිතල පහසුකම් ප්‍රමාණයක් අවශ්‍ය වනුයේ වැලිකඩ	රැඳවියන්ගේ සනීපාරක්ෂාවට අදාළ නියමිත ඉල්ලීම් 2025 වසරේ වෙන් වූ ප්‍රතිපාදනවලින් ඉටුකිරීමට බන්ධනාගාර අධිකාරීවරුන් දැනුවත්කර ඇත.	පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නේවාසිකයන්ට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට කටයුතු කළ යුතු ය.

	බන්ධනාගාරය වෙත බවත් තහවුරු විය.		
(ඌ)	2013 වර්ෂයේ දී පුනරුත්ථාපන හා බන්ධනාගාර අමාත්‍යාංශය විසින් විධිමත් පවරාදීමකින් තොරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ දළුපොත තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය වෙත ලබා දී තිබූ අංක PA – 7034 දරන කැබ් රථයට අදාළව කිසිදු ලියකියවිල්ලක් ලබානොදීම නිසා 2013 වර්ෂයේ සිදුකර ගැනීමට හැකිව තිබූ අලුත්වැඩියාවක් සිදුකර ගැනීමට නොහැකිවීම හේතුවෙන් මෙම කැබ් රථය 2013 වර්ෂයේ සිට මේ දක්වා ධාවනය නොකර තිබූ අතර, 2024 වර්ෂයේදී අපහරණය සඳහා නිර්දේශකර තිබුණි.	අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.	අලුත්වැඩියාවක් සිදුකළ යුතු පළමු අවස්ථාවේදීම එම අලුත්වැඩියාව විධිමත් පරිදි සිදු කිරීමට කටයුතු කළ යුතු ය.
(එ)	අධිකරණය මගින් රාජසන්තකකර බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති වාහන 36ක් බන්ධනාගාර ආයතන 18ක් තුළ 2024 දෙසැම්බර් 31 දින වන විට රඳවා තබාගෙන ඇති බවත්, ඉන් වාහන 08ක් පමණක්, වර්තමානයේ දී ධාවනය වන අතර, ඉතිරි වාහන 28ක ප්‍රමාණය ධාවනයෙන් ඉවත්කර ඇති බවත් හෙළිදරව් විය.	අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.	රාජ්‍ය ආයතන මගින් වාහන ලබා ගැනීමේ දී බන්ධනාගාර කොමසාරිස් ජනරාල් නමින් ලියාපදිංචි කිරීම සඳහා විධිමත් පියවරගත යුතු ය.
(ඒ)	බන්ධනාගාර ආයතනවල ඉඩම් කැබලි 49ක අක්කර 357.8139ක් වූ ඉඩම් ප්‍රමාණයක හිමිකම පවරාගැනීම සිදුකර නොතිබුණ ද, මෙම ඉඩම් බන්ධනාගාර, සිරමැදිරි, එළිමහන් සිරකඳවුරු, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා ගොවිපොළවල් වශයෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණි.	හිමිකම් පවරාගැනීමේ කටයුතු සිදු කරමින් පවතී.	මෙම ඉඩම්වල හිමිකම පවරා ගැනීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතු ය.
(ඔ)	බන්ධනාගාර තදබදය අවම කිරීම සඳහා බොරැල්ලේ පිහිටි වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය (බන්ධනාගාර මූලස්ථානය, වැලිකඩ බන්ධනාගාරය, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය, බන්ධනාගාර රෝහල, කාන්තා අංශය හා මැගසින් බන්ධනාගාරය) හොරණ මිල්ලෑව ප්‍රදේශයේ ප්‍රතිස්ථාපනය	මේ සම්බන්ධව අධිකරණ අමාත්‍යාංශය සමග සාකච්ඡාවක් පැවැත් වූ අතර, ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව දන්වා සිටිමි.	මේ සම්බන්ධව රජයේ වර්තමාන ප්‍රතිපත්තිය අනුව කඩිනමින් හා විධිමත් ක්‍රියාමාර්ගගත යුතු ය.

කිරීමේ ව්‍යාපෘතියක් සැලසුම්කර තිබූ අතර, හෙක්ටයාර් 16.436ක් පමණ වන මෙම ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට 2022 නොවැම්බර් 16 දින නිදහස් දීමනා ක්‍රමයක් මගින් පවරාගෙන තිබුණ ද, හොරණ මිල්ලෑව ප්‍රදේශයේ පිහිටි ඉඩම බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත පවරා දී නොතිබුණි. 2024 ජනවාරි 11 දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව අනුව බොරැල්ල පිහිටි ඉඩමේ වටිනාකම රු.31,844,850,000ක් වූ අතර, හිමිකම පවරා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ගිණුම්ගතකර නොතිබුණි. කොළඹ පිහිටි ප්‍රධාන බන්ධනාගාර ඉදිකිරීම සිදුනොකිරීම තුළින් බන්ධනාගාර තදබදය නිසා පෙරටත් වඩා ගැටලු රාශියකට බන්ධනාගාර දෙපාර්තමේන්තුව වර්තමානයේ මුහුණ දී තිබුණි.

4.8. පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වසර 10කට වඩා වැඩි කාලයක සිට පැවත එන වාහන අනතුරු 22ක් ඇතුළු සිද්ධීන් 26කට අදාළ අලාභය රු.35,144,088ක් ද, වසර 05 සිට 10 අතර කාලයක සිට පැවත එන වාහන අනතුරු 65කට අදාළ අලාභය රු.14,593,813ක් ද, වර්ෂ 05කට වඩා අඩු කාලයක සිට පැවත එන වාහන අනතුරු 55ක් ඇතුළුව සිද්ධීන් 56ක් සම්බන්ධ අලාභය රු.49,743,400ක් විය.	2024 ගිණුම් වර්ෂයට අදාළව වසර 10කට වඩා වැඩි දේපළ හා රිය අනතුරු අලාභහානි 26කින් (රු.35,144,088) රිය අනතුරු 04ක් (රු.2,174,631) සම්බන්ධ අලාභ හානි කපාහැරීමේ අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍යාංශය වෙත යොමුකර ඇති අතර, තංගල්ල හා ගාල්ල බන්ධනාගාරවල සිදුවී ඇති දේපළ හානි සඳහා (රු.2,697,490) අධිකරණ කටයුතු පැවැත්වෙන බැවින් කපාහැරීමේ කටයුතු සිදුකළ නොහැකිව ඇත. ඉතිරි අලාභ හානි පිළිබඳ කටයුතු කිරීම සඳහා කමිටුවක් පත්කර එම කමිටුවේ නිර්දේශ ලබාගනිමින් කපාහැරීමේ කටයුතු සිදුකරගෙන යනු ලැබේ.	මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

(ආ)	2021 නොවැම්බර් 22 වන දින NC-5426 දරන වැන්රථය අනතුරකට ලක්ව තිබූ අතර, නියෝජිත සමාගම මගින් වාහනයේ අලුත්වැඩියාව සඳහා රු.8,656,243ක ඇස්තමේන්තුවක් ඉදිරිපත්කර තිබුණි. නියමිත කාලසීමාව තුළ දී අලුත්වැඩියාව නිමකර පරීක්ෂණය සඳහා ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති බැවින්, අදාළ රක්ෂණ සමාගම මෙම රක්ෂණ හිමිකමේ ඉදිරි කටයුතු සිදුකිරීමට නොහැකි බව දන්වා තිබුණි. පසුව මෙම වාහනය සඳහා රු.500,000ක උපරිම මුදලක් රක්ෂණ ආයතනය අනුමතකර තිබූ අතර, අලුත්වැඩියා සිදුකිරීම 2025 අප්‍රේල් 30 දින වන විට පෞද්ගලික ආයතනයක් මගින් සිදුකරනු ලබන බවත්, අලුත්වැඩියා කිරීමේ වියදම රු.4,300,000ක් වන බවත්, ඒ අනුව මෙම වාහන අනතුර මගින් සිදු වූ හානිය පූර්ණ ලෙස රක්ෂණ ආයතනය මගින් ප්‍රතිපූරණයකර ගැනීමට වගකිව යුතු නිලධාරීන් කටයුතුකර නොතිබුණි.	අංක NC-5426 වැන් රථයේ 2021 නොවැම්බර් 22 දින සිදු වූ අනතුරෙහි අලුත්වැඩියාව නිම වී නොමැති බැවින්, පූර්ණ වාර්තා ඉදිරිපත්කර නොමැත. (වාහන අනතුර මගින් සිදු වූ හානිය පූර්ණ ලෙස රක්ෂණායතනය මගින් ප්‍රතිපූරණයකර ගැනීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා ඉදිරි අවශ්‍ය කටයුතු සිදුකිරීමට නියමිත ය.)	මුදල් රෙගුලාසි 103, 104 හා 156(1) ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ඇ)	මුදල් රෙගුලාසි 109(1) (අ) අනුව හානියෙන් අයකරගත යුතු උපරිම වටිනාකම සහ අයකර ගැනීමට තීරණය කරන මුදලත් අතර යම් වෙනසක් ඇතොත් ඒ වෙනස පොතෙන් අස්කර දැමීමට විධිවිධාන සලසා ඇති අතර, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2024 මූල්‍ය ප්‍රකාශනවල පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශනයේ (ඇමුණුම II)හි වර්ෂය තුළ මුදල් රෙගුලාසි 109 යටතේ වන පොතෙන් කපාහැරීම හා අයකර ගැනීම පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් අනතුරු 53කට අදාළ රු.4,134,753ක අලාභ වටිනාකම් සඳහා අධිහාර හා රක්ෂණ මගින් අයකරගෙන ඇති රු.3,681,782ක අයවීම් පිළිබඳ තොරතුරු සටහන්කර නොතිබුණි.	ඉදිරියේ දී එම තොරතුරු අදාළ පරිදි මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත.	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.

4.9 විගණන විමසුම්වලට පිළිතුරු ලබානොදීම

දෙපාර්තමේන්තුව වෙත නිකුත්කරන ලද පහත විස්තරය සඳහන් විගණන විමසුම සඳහා 2025 ඔක්තෝබර් 13 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි.

විගණන විමසුම පිළිබඳ විස්තරය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව වෙත නිකුත්කරන ලද විගණන විමසුම් 15ක් සඳහා 2025 ඔක්තෝබර් 13 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි.	බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අදාළ විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම විගණකාධිපතිවරයාට අවශ්‍ය වන නිශ්චිත කාලසීමාවක් තුළ සිදුකිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරින් විසින් සහතික විය යුතු වුව ද, බොහෝ විගණන විමසුම් සඳහා බන්ධනාගාර ආයතන වෙතින් සහ අදාළ අනෙකුත් අංශ වෙතින් පිළිතුරු කැඳවා අදාළ පිළිතුරු මූලස්ථානය මගින් සාරාංශ ගතකර විගණනය වෙත ඉදිරිපත් කිරීම සිදු කරන බැවින් ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගත වේ.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඉ) වගන්තිය හා මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලබන වෙනත් ඕනෑම නිලධාරියෙකු විසින් තමන් වෙත අමතනු ලබන ලිඛිත හා විමසීම් පිළිබඳ අප්‍රමාදව ක්‍රියාකොට ඒවාට සම්පූර්ණ පිළිතුරු සැපයීමට ගණන්දීමේ නිලධාරියා කටයුතු කළ යුතු ය.

4.10 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) නිලධාරින්ට රජයේ නිවාස ලබාදීම හා නිවාස කුලී අයකිරීම		
(i) කිසියම් රජයේ නිවාසයක් ඉදිකිරීමේ දී ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 2.3.1 උපවගන්තිය මගින් හඳුන්වා දී ඇති ආදර්ශ සැලසුම් අනුව ඉදිකිරීම්කර ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 3 වන වගන්තිය ප්‍රකාරව ඒ ඒ ශ්‍රේණියට	ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 2.3.1 උපවගන්තියට අනුව ඉදිරියේ දී කටයුතු කිරීමට ඉංජිනේරු අධ්‍යක්ෂකගේ අවධානයට යොමුකර ඇත.	ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 2.3.1 උපවගන්තිය පරිදි කටයුතු කළ යුතු ය.

	හෝ තනතුරට අදාළව නිවාස ශ්‍රේණිගත කළ යුතු වුවත්, එපරිදි සැලසුම්කර ඉදිකිරීම සහ ශ්‍රේණිගත කිරීම සිදුකර නොතිබුණි.		
(ii)	ද්විතික මට්ටමේ තනතුරු සඳහා වෙන්කරන ලද රජයේ නිවාස තෘතියීක මට්ටමේ තනතුරු දරන නිලධාරීන් සඳහා ලබාදීම හේතුවෙන් ද්විතික මට්ටමේ තනතුරු දරන නිලධාරීන්ට නිවාස ලබාගැනීමේ දී ගැටළුවලට මුහුණදීමට සිදු වී තිබුණි.	දෙවන පෙළ ජේලර් නිලධාරීන් ලෙස උසස්වීම් ලද නිලධාරීන් කිහිපදෙනෙකු ඔවුන්ට අයත් නිලනිවාස ලැබෙන තෙක් සේවා අවශ්‍යතාවය මත කණිෂ්ඨ නිලධාරීන්ගේ නිවාසවල සිටින අතර, පසුගිය කාලයේ පළමු පෙළ ජේලර් නිලධාරීන්ගේ තනතුරු වැඩිවීමක් සිදුව ඇති බැවින්, දෙවන පෙළ ජේලර්වරුන්ගේ නිලනිවාස කිහිපයක් සේවා අවශ්‍යතාවය මත ඔවුන්ට ලබාදීමට සිදුව ඇත.	එක් එක් තනතුර සඳහා වෙන්කර ඇති රජයේ නිවාස එම තනතුරු දරන නිලධාරීන්ට පමණක් ලබාදීමට කටයුතු කළ යුතු ය.
(iii)	නියාමකයන් සහ සැරයන්වරුන් සඳහා වෙන්කර ඇති B ගොඩනැගිල්ල සහ C සහ D මහල් නිවාස ද කාලීනව අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් පරිහානියට පත්වෙමින් පවතින බවත්, නියාමකයන් සහ සැරයන්වරුන්ගේ පේළි නිවාස සංකීර්ණය අබලන්ව ඉතා අනාරක්ෂිත තත්ත්වයක පවතින බවත්, එහි අවට පරිසරය ද ඉතාමත් අයහපත් තත්ත්වයක පවතින බැවින්, එම නිවාස මිනිස් වාසය සඳහා නුසුදුසු බවත්, ජේලර්වරුන් සඳහා වෙන්කර ඇති ඉතා පැරණි නිවාස කඩිනමින් අලුත්වැඩියා කළ යුතුව තිබුණි.	තව ද, මෙම ගොඩනැගිලිවල අලුත්වැඩියා කටයුතු ඉදිරියේදී සිදු කිරීමට නියමිතව ඇත. මෙහි සඳහන් පේළි නිවාස අලුත්වැඩියා කිරීමට වඩා ඉවත්කර අළුතින් ඉදිකිරීම වඩා යෝග්‍ය වන අතර, එම කටයුතු ඉදිරියේ දී කිරීමට නියමිත ය.	අලුත්වැඩියා කළ යුතු රජයේ නිවාස හඳුනාගෙන කඩිනමින් අලුත්වැඩියා කිරීමට පියවරගත යුතු ය.
(ආ)	රටවල් 15ක් සඳහා සිරකරුවන් මාරුකිරීමේ ගිවිසුම්වලට එළැඹ නොමැති බැවින්, එම රටවල් වෙත අදාළ සිරකරුවන් භාරදීමේ ගැටළුවක් මතු වී ඇති අතර, 2024 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාරගතව සිටින විදේශ සිරකරුවන් 170දෙනෙකුට අදාළ වන ඒ ඒ රටවල්වල ආහාර රටාවට ගැළපෙන ආකාරයට ආහාරපාන වර්ග ලබාදිය යුතු වීමත්, ඒ සඳහා අමතර	ඉදිරියේ දී ඒ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කිරීමට නියමිත ය.	විදෙස් සිරකරුවන් අදාළ රටවල් වෙත භාරදීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු ය.

පිරිවැයක් දැරීමට සිදුව ඇත. බන්ධනාගාර ආයතනවල රැඳවිය හැකි රැඳවි ධාරිතාවය ඉහළ ගොස් ඇති පසුබිමක විදේශ සිරකරුවන් අදාළ රටවල් වෙත භාරදීම තුළින් එම සංඛ්‍යාවෙන් හෝ බන්ධනාගාර තදබදය අඩුකරගත හැකිව පැවතුණි.		
(ඇ) බන්ධනාගාර ආයතන 21ක මළාපවාහන ප්‍රතිකාරක පද්ධති (Treatment Plant) සහ මළාපවාහන පද්ධති (Sewerage System) පරීක්ෂාවේ දී පහත කරුණු හෙළිදරව් විය.		
(i) බන්ධනාගාර ආයතන 05ක මළාපවාහන ප්‍රතිකාරක පද්ධති (Treatment Plant) පැවතිය ද, බෝගම්බර සහ බූස්ස යන බන්ධනාගාර දෙකෙහි පමණක් එම පද්ධති ක්‍රියාකාරීව පවතින බවත්, බූස්ස බන්ධනාගාරයේ මළාපවාහන ප්‍රතිකාරක පද්ධතිය 2001 වර්ෂයේ දී ඉදිකර ඇති බැවින්, එම යන්ත්‍රසූත්‍ර සහ නළ පද්ධතිය නවීකරණය කිරීම අවශ්‍ය වන අතර, පොළොන්නරුව, අගුණකොළපැලැස්ස, යාපනය යන බන්ධනාගාර ආයතනවල සහ බෝගම්බර බන්ධනාගාර නිලධාරින්ගේ නිලනිවාස හා බැරැක්ක ආශ්‍රිත මළාපවාහන ප්‍රතිකාරක පද්ධති ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති බවත්, අගුණකොළපැලැස්ස බන්ධනාගාරයේ මළාපවාහන ප්‍රතිකාරක පද්ධතිය නිසිඅයුරින් ක්‍රියාත්මක නොවීමත් මළාපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය නොකර මුදා හැරීම නිසා පාරිසරික හා සාමාජීය ගැටළු රාශියක් ඇතිව තිබුණි. මෙම පද්ධතිවල යන්ත්‍රසූත්‍ර හා භූගත නළ පද්ධති නිසිලෙස ක්‍රියාත්මක නොවීම මගින් අපිරිසිදු ජලය සෘජුවම බාහිර පරිසරයට බැහැරවීම ආදී ගැටළු හේතුවෙන් සිදුවන පාරිසරික හානිය වළක්වා ගැනීම සඳහා මේ	අදාළ බන්ධනාගාර ආයතන දැනුවත්කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් ඇත.	බන්ධනාගාර ආයතනවල මළාපවාහන ප්‍රතිකාරක පද්ධති විධිමත්ව සකස් කිරීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු ය.

	දක්වා තිරසර ක්‍රියාමාර්ගයක් ලබාගෙන නොතිබුණි.		
(ii)	කෑගල්ල, අනුරාධපුරය, මොණරාගල, වාරියපොළ, නව මැගසින්, කොළඹ රිමාන්ඩ් හා වැලිකඩ යන බන්ධනාගාර ආයතනවල මළාපවහන පද්ධතිවල ගලිවළවල් කඩාවැටීම භූගත නළමාර්ග කැඩීයාම, මළාපවාහන පද්ධතිය ප්‍රමාණවත් නොවීම නිසා නිරතුරුව උතුරා යාම හේතුවෙන් පාරිසරික හා සාමාජීය ගැටළු රාශියක් සිදුව තිබුණි.	අදාළ බන්ධනාගාර ආයතන දැනුවත්කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් ඇත.	බන්ධනාගාර ආයතනවල මළාපවාහන ප්‍රතිකාරක පද්ධති විධිමත්ව සකස් කිරීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු ය.
(iii)	මළාපවාහන ප්‍රතිකාරක පද්ධතිය සහ මළාපවාහන පද්ධති පවතින බොහෝ බන්ධනාගාර ආයතනවලින් විශාල පරිසර හානියක් සිදුවන බවත්, ඒ සඳහා ස්ථිර විධිමත් විසඳුමක් මේ දක්වා ලැබී නොතිබුණි.	අදාළ බන්ධනාගාර ආයතන සහ ඉංජිනේරු අංශය සමග සාකච්ඡා කර හැකි ඉක්මනින් නිසිපරිදි මළාපවහන පද්ධතියේ අඩුපාඩු සකස්කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට නියමිත ය.	මළාපවාහන ප්‍රතිකාරක පද්ධතිය සකස්කර පරිසර හානිය වැළැක්වීමට ක්‍රියාමාර්ග ගත යුතු ය.
(ඇ)	වැලිකඩ බන්ධනාගාර කර්මාන්ත අංශයේ ස්ථාපිතකර ඇති බෑග් නිෂ්පාදන ව්‍යාපෘතිය පරීක්ෂාවේ දී පහත කරුණු හෙළිදරව් විය.		
(i)	බන්ධනාගාර දෙපාර්තමේන්තුව සහ බෑග් නිෂ්පාදනය කරනු ලබන පෞද්ගලික සමාගම අතර 2023 අප්‍රේල් 25 දින අත්සන් කරන ලද ගිවිසුමට අනුකූලව කටයුතු නොකර, පැරණි ගිවිසුම අනුව සිරකරු වේතන ගෙවීම නිසා සිරකරුවන්ට, රජයට හා සිරකරු සුභසාධක අරමුදලට පිළිවෙලින් 2023 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා රු.1,281,440ක් හා රු.2,667,944ක් අඩුවෙන් ගෙවීම් සිදුකර තිබුණි.	විගණන නිරීක්ෂණයේ සඳහන් පරිදි 2023 ජනවාරි මස සිට 2023 සැප්තැම්බර් මස දක්වා පැරණි ගිවිසුමේ සඳහන් පරිදි සිරවේතන අයකර ගැනීමට කටයුතුකර ඇත. පෞද්ගලික ආයතනය විසින් 2023 සැප්තැම්බර් 18 දිනැති ලිපිය මගින් පෙර ගිවිසුම් සඳහන් පරිදි වැටුප් ගෙවීම සඳහා සමාගමට ඇති වී තිබූ අපහසුතා පිළිබඳව කරුණු දක්වා සහන කාලයක් ඉල්ලා සිටි අතර, ඒ අනුව සම්භාණ්ඩ ක්ෂේත්‍රයේ එවකට පැවැති තත්ත්වයන් සැලකිල්ලට ගෙන දීර්ඝ කාලයක් මෙම ව්‍යාපෘතිය ඉතා සාර්ථකව සිදුකිරීම හා එම ව්‍යාපෘතිය මගින් රැඳවි පුනරුත්ථාපනයට සිදුවන දායකත්වය ද සලකා සහන කාලයක් ලබාදීමට මගේ අංක බන්ධ/මූල/පුන /පී.ජී මාටින්/2023	නව ගිවිසුම අනුව කටයුතු කළ යුතු ය.

		හා 2023 ඔක්තෝබර් 11 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී ඇත.	
(ii)	බන්ධනාගාර දෙපාර්තමේන්තුව සහ බෑග් නිෂ්පාදන පුද්ගලික සමාගම සමග ඇතිකර ගෙන ඇති නව ගිවිසුමේ 23 ඡේදය ප්‍රකාරව රජයේ ආදායමට සහ සිරකරු සුභසාධක අරමුදලට ගෙවිය යුතු මුදල වෙන්වෙන් වශයෙන් වූ චෙක්පත් දෙකක් මගින් පුනරුත්ථාපන අංශය වෙත ඊළඟ මස 15 වන දින හෝ එදිනට පෙර ඉදිරිපත් කළ යුතු වුව ද, එසේ නියමිත දිනයේ දී ගෙවීම් කිරීමට අපොහොසත් වුවහොත් නව ගිවිසුමෙහි 25 ඡේදය ප්‍රකාරව රජයේ ගාස්තුව වශයෙන් සියයට 10ක ප්‍රමාද ගාස්තුවක් රජයට ගෙවිය යුතු වන අතර, එය දින 07ක උපරිමයකට යටත් විය යුතු වුව ද, 2025 ජනවාරි සිට මැයි දක්වා ගෙවීම් පරීක්ෂාවේ දී දින 19ත් 88ත් අතර කාලප්‍රමාදයක් පැවතිය ද ප්‍රමාද ගාස්තු ගෙවා නොතිබුණි.	ගිවිසුමේ අංක 24 හා 25 වගන්තිවලට අනුව ප්‍රමාද ගාස්තු අයකරගැනීම් සම්බන්ධයෙන් අපැහැදිලිතාවයක් නිරීක්ෂණය වන අතර, අදාළ පාර්ශවයන් සමග සාකච්ඡාකර ඉදිරි මාස දෙකක කාලයක් ඇතුළත ගිවිසුමේ සංශෝධනයක් කිරීමට කටයුතු කරන බව ද දන්වා සිටිමි.	ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු ය.
(iii)	නේවාසිකයන් නිදහස්වීමෙන් පසු මෙම කර්මාන්තයට අදාළ වෘත්තියන්හී නියැලීමට පහසු වන පරිදි ආයතනයෙන් විධිමත් සහතිකපත්‍රයක් ලබාදීමට දෙපාර්තමේන්තුව මගින් කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් පුද්ගලික සමාගම සමග සාකච්ඡාකර සහතිකපත්‍රයක් ලබාදීම සම්බන්ධයෙන් ඉදිරියේ දී කටයුතු කිරීමට සැලසුම් සකස්කරමින් පවතින බව දන්වා සිටිමි.	පුහුණුවෙන් පසු විධිමත් සහතික පත්‍ර ලබාදීමට කටයුතු කළ යුතු ය.
(ඉ)	රට තුළ කවර හෝ අධිකරණයක අධිකාරී බලය යටතේ බන්ධනාගාර ගත කරන ලද හෝ රිමාන්ඩ් භාරයට පත් කරන ලද සෑම තරාතිරමකටම අයත් රැඳවියන්ගේ ආරක්ෂාව හා රැකවරණය බන්ධනාගාර නීතිරීතිවලට අනුකූලව සැලසීම හා රැඳවියන් පුනරුත්ථාපනයකර යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් බවත්, දඬුවම් කාලය අවසන්වීමට පෙර නීත්‍යානුකූල නොවන ආකාරයෙන් පැනගිය/ මිදීගිය සිරකරුවන් හෝ සැකකරුවන්	මේ සම්බන්ධයෙන් අදාළ අංශ සමග සාකච්ඡාකර නවීන තාක්ෂණය ද භාවිතා කරමින් අවශ්‍ය කටයුතු කිරීමට නියමිත ය.	රැඳවියන් පැනයාම/ මිදීයාම වැළැක්වීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු ය.

	සංඛ්‍යාව පසුගිය වසර 06ක කාලපරිච්ඡේදය තුළ 995ක් ද, නැවත අත්අඩංගුවට නොගත් සංඛ්‍යාව 554ක් ද විය.		
(ඊ)	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ CCTV කැමරා සම්බන්ධ පරීක්ෂාවේ දී පහත කරුණු හෙළිදරව් විය.		
	(i) 2024 ජුනි 31 දින වන විට බන්ධනාගාර ආයතන 14ක CCTV කැමරා 792ක් සවිකර තිබූ අතර, ඉන් කැමරා 458ක් පමණක් ක්‍රියාකාරී තත්ත්වයේ පවතින අතර, කැමරා 334ක් එනම් සියයට 42ක් අක්‍රීයව පැවතුණි. විගණනයට ලබා දී ඇති තොරතුරු අනුව අක්‍රීය වූ CCTV කැමරා වසර දෙකකට අධික කාලයක සිට අක්‍රීයව පවතින බව හෙළිදරව්වීමෙන්, බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් CCTV කැමරා සවිකිරීමේ ප්‍රධාන අරමුණ සාක්ෂාත්කර ගැනීම අභියෝගයක්ව පැවතුණි.	මෙම වර්ෂයේ අයවැයෙන් මෙම කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර ඇත.	සියලු බන්ධනාගාර ආයතන සඳහා සක්‍රීය CCTV කැමරා පද්ධතියක් හඳුන්වා දිය යුතු ය.
	(ii) 2023 ජුනි 09 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දී ලබාදුන් නියෝග අනුව සිරකරුවන්ට ආරක්ෂාව හා රැකවරණය සලසමින් ඔවුන් පුනරුත්ථාපනයකර සමාජගත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම සමග ඉදිරිපත් කර තිබූ බන්ධනාගාර ආයතන සඳහා අවශ්‍ය නවීන තාක්ෂණ ආරක්ෂක උපකරණ ලබා ගැනීමේ ව්‍යාපෘති යෝජනාවෙහි සඳහන් පරිදි මෙම සියලු ආරක්ෂක උපකරණ නඩත්තුව හා මෙහෙයවීම සඳහා සුදුසු තාක්ෂණික දැනුමකින් යුත් තාක්ෂණික ප්‍රධානියෙක් සහ තාක්ෂණික ශිල්පීන්ගෙන් සමන්විත තාක්ෂණික ඒකකයක් ඇති කිරීම අත්‍යාවශ්‍ය වන බව කමිටු යෝජනාවක් ලෙස	මේවන විට ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම සහිත නිලධාරින් බඳවාගැනීමට සහ අවශ්‍ය පුහුණු කටයුතු සඳහා පියවර ගනිමින් පවතී.	රජයේ ගිණුම් කාරක සභාව දුන් නියෝග ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය.

	ඉදිරිපත්කර තිබුණු ද, ඒ සඳහා විධිමත් පියවරගෙන නොතිබුණි.		
(උ)	බන්ධනාගාර ආයතන 18ක් තුළින් 2024 පළමු මාස 07 තුළ දුම්කොළ, හෙරොයින්, අයිස්, ගංජා, හැෂ් සහ මත්පෙති අත්අඩංගුවට ගෙන ඇති අතර, මෙම තහනම් මත්ද්‍රව්‍ය බන්ධනාගාර රැඳවියන් වෙත ලැබීම වැළැක්වීම සඳහා විධිමත් පියවරගෙන නොමැති අතර, එම තත්ත්වය විධිමත් පුනරුත්ථාපන ක්‍රියාවලියට බාධාවක් වී පැවතුණි.	ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගනිමින් පවතී.	තහනම් මත්ද්‍රව්‍ය බන්ධනාගාර රැඳවියන් වෙත ලැබීම වැළැක්වීම සඳහා විධිමත් පියවරගත යුතු ය.
(ඌ)	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කර්මාන්ත අංශයේ සංවර්ධනය පිළිබඳ පරීක්ෂාවේ දී පහත කරුණු හෙළිදරව් විය.		
	(i) බන්ධනාගාර ආයතනවල කර්මාන්ත අංශයන්හී සේවයේ නියුතු නිලධාරින්ට ආරක්ෂිත මෙවලම් ප්‍රමාණවත් පරිදි නොමැතිවීම, නව තාක්ෂණික ක්‍රම සහ යන්ත්‍ර උපකරණ නොමැතිවීම, ස්ථාන මාරුවීම් හා උසස්වීම් සම්බන්ධ ගැටළු, සියලුම වෘත්තීය උපදේශකවරු/කෘෂි උපදේශකවරු සිටිය යුතු වැටුප් තලයේ පිහිටුවා නොමැතිවීම, අදාළ ක්ෂේත්‍රයට අනුව වෘත්තීය පුහුණු සැසි නොපැවැත්වීම, තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදුනොකිරීම, වෘත්තීය පුහුණු කටයුතු කරගෙන යාම සඳහා ඉඩපහසුකම් සහිත ගොඩනැගිලි හා අමුද්‍රව්‍ය තොග ප්‍රමාණවත් පරිදි පවත්වාගෙන නොයාම, කර්මාන්ත වැඩ මූලික තනතුරෙන් ඉහළට තනතුරක් නොමැතිවීම, පිටත වැඩ සඳහා සිරකරුවන් රැගෙන යාමට ප්‍රමාණවත් නිලධාරින් නොමැති වීම සහ රාජකාරී සිදුකිරීමේ දී ඉලක්කගත සැලසුමක් නොමැති වීම වැනි වෘත්තීය ගැටළු පැවතුණි.	මේ සඳහා බඳවාගැනීම් කටයුතු හා අනෙකුත් අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතී.	කර්මාන්ත අංශයෙහි සේවයේ නිරත නිලධාරින්ගේ වෘත්තීය ගැටළු සඳහා විසඳුම් ලබා දීමට කටයුතු කළ යුතු ය.

(ii)	පවතින ප්‍රතිපාදන ගැටළු, ප්‍රමාණවත් සිරකරුවන් නොයෙදවීම හා අමුද්‍රව්‍ය හිඟවීම ආදී කරුණු හේතුවෙන් 2024 සැප්තැම්බර් 02 දින සිට 06 දින දක්වා වූ දින 05ක කාලපරිච්ඡේදය තුළ බන්ධනාගාර ආයතන 15ක කර්මාන්ත අංශ 62ක සේවය සඳහා යෙදවිය හැකි සිරකරුවන් සංඛ්‍යාව 11,434ක් වුව ද, සේවයේ යෙද වූ සිරකරුවන් සංඛ්‍යාව 6,013ක් වීම තුළින් කර්මාන්ත අංශයේ සේවය සඳහා සිරකරුවන් 5,421ක් යොදවා නොතිබුණි.	කර්මාන්ත අංශයේ සේවය සඳහා යොදවා නොතිබුණු 5,421ක් වන සිරකරුවන් අතරට ගෘහසේවයේ සිරකරුවන්, විශේෂ ගණයේ සිරකරුවන්, කෙටි කාලීන සිරකරුවන්, මරණ දණ්ඩනය නියම වූ සිරකරුවන් ආදීන් ඇතුළත් වේ. එබැවින් ඔවුන් කර්මාන්ත අංශයේ සේවයේ නොයෙදවිණි.	කර්මාන්ත අංශය සඳහා වැඩි සිරකරුවන් ප්‍රමාණයක් සේවයේ යෙදවීම සඳහා කටයුතු කළ යුතු ය.
(iii)	බන්ධනාගාර ආයතන 08ක බ්ලොක් ගල් නිෂ්පාදනය, කම්මල් අංශය, වඩු කර්මාන්තය, ලී ඉරුම් අංශය, වාහන සේවා අංශය, බේකරි අංශය කොහු ඉදල් අංශය සහ මල් පෝච්චි අංශය යන කර්මාන්ත අංශයන් අක්‍රීය වී ඇති තත්ත්වයක් හෙළිදරව් විය. එම ආයතන විසින් හඳුනාගෙන තිබූ හේතු සඳහා අවශ්‍ය පිළියම් යොදා එම කර්මාන්ත නිෂ්පාදන අංශ යළි ඇති කිරීමට විධිමත් පියවරගෙන නොතිබුණි.	මෙම අංශයන් සඳහා යෙදවීමට සිර ගහණය අඩුවන අතර, රිමාන්ඩ් අයවලුන් ද යෙදවිය නොහැක. එනමුත් හැකි සෑම අවස්ථාවකම මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.	මෙම කර්මාන්ත අංශය නැවත සක්‍රීයකර නිෂ්පාදන ක්‍රියාවලිය මගින් සිරකරුවන් පුනරුත්ථාපනය සඳහා කටයුතු කළ යුතු ය.
(iv)	බන්ධනාගාර ආයතනවල කර්මාන්ත නිෂ්පාදන අලෙවි කිරීම සඳහා යොදා ඇති ක්‍රමවේදයන් පරීක්ෂාවේ දී බූස්ස, කොළඹ රිමාන්ඩ්, බදුල්ල, ගාල්ල, කුරුවිට හා අඟුණකොළපැලැස්ස යන බන්ධනාගාර ආයතනවල නිෂ්පාදන අලෙවි කිරීම සඳහා එම බන්ධනාගාර තුළ අලෙවිසැල් පිහිටුවා නොමැති බවත්, අලෙවිසැල් පිහිටුවා ඇති බෝගම්බර, වටරැක, අනුරාධපුරය, පල්ලෙකැලේ, වැලිකඩ, වීරවිල හා තල්දෙන යන බන්ධනාගාර ආයතනවල එම අලෙවිසැල්වල ඉඩකඩ ප්‍රමාණවත්ව නොපැවතුණි.	මේ වන විට වෘත්තීය සුදුසුකම් සලකා බලා ඊට අදාළ සහතිකයක් ලබා දී මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකිරීමට පියවර ගනිමින් පවතින බව දන්වමි.	කර්මාන්ත නිෂ්පාදන අලෙවි කිරීම සඳහා සියලුම බන්ධනාගාර ආයතනවල අලෙවිසැල් පිහිටුවීමට කටයුතු කළ යුතු ය.

(v)	බන්ධනාගාර ආයතනවල එක් එක් කර්මාන්ත අංශයන්ට අවශ්‍ය යන්ත්‍ර හා උපකරණවල ඌණතා පැවති අතර, එම ආයතනයන්හි ප්‍රශස්ථ නිෂ්පාදන ක්‍රියාවලියට දායකවීම සඳහා බන්ධනාගාර ආයතන 10ක යන්ත්‍ර හා උපකරණ 227ක අවශ්‍යතාවයක් පවතින බව අනාවරණය විය.	මේ සම්බන්ධව සියලුම බන්ධනාගාර ආයතනවල යන්ත්‍රෝපකරණ සම්බන්ධ සංගණනයක් සිදුකර ප්‍රමුඛතාවය මත එක් එක් බන්ධනාගාර ආයතනවලට අවශ්‍ය යන්ත්‍රෝපකරණ සම්පාදනයට අවශ්‍ය පියවර ගැනීමට නියමිත ය.	අවශ්‍ය යන්ත්‍ර හා උපකරණ ලබාදීමට කටයුතු කළ යුතු ය.
(vi)	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වන කාලීන අවශ්‍යතාවයට ගැළපෙන පරිදි රැඳවියන් පුනරුත්ථාපනයකර යහපත් පුරවැසියන් ලෙස සමාජගතවීමට අවශ්‍ය පසුබිම සැකසීම සඳහා බන්ධනාගාර ආයතනවල පවතින කර්මාන්ත අංශයන්හි වෘත්තීය පුහුණුව ලබා පුනරුත්ථාපනය වන සිරකරුවන් සඳහා එම පුහුණුවෙන් පසු NVQ සහතිකපත්‍ර ලබාදීමේ විධිමත් වැඩපිළිවෙලක් පවත්වා ගැනීම තුළින් එම සිරකරුවන් සමාජගත වීමේ දී ස්වාධීන රැකියාවකට යොමුවීමේ අවස්ථාවක් පවතින බවත්, එමගින් සිරකරුවන් නැවත බන්ධනාගාරගතවීම වැළැක්වීම තුළින් වාර්ෂිකව වැයවන මුදල් ඉතිරිකර ගනිමින් මෙම සිරකරුවන් රටට වැඩදායී පුද්ගලයන් බවට පත්කර ගැනීමට හැකියාව ලැබෙනු ඇති බවත්, ඒ සඳහා විධිමත් පොදු වැඩපිළිවෙලක් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් සියලුම බන්ධනාගාර අධිකාරීවරුන් දැනුවත්කර අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතු කරනු ලැබේ.	රැඳවියන් පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස සමාජගතවීමට අවශ්‍ය පසුබිම සැකසිය යුතු ය.
(එ)	රැඳවියන් බැලීමට එන පුද්ගලයන් විසින් බැහැරකරන ප්ලාස්ටික් බෝතල් විකිණීමට ක්‍රමවේදයක් නොමැති අතර, ඉතිරිවන පොල්කටු අඟුරු බවට පත් කිරීම, පොල්කටු විකිණීමෙන් ආදායමක් ලබාගත හැකි වුව ද, බන්ධනාගාර ආයතන 06ක් පමණක් එවැනි ක්‍රමවේදයක් ඇතිකරගෙන ඇති බවත්, බන්ධනාගාර ආයතනවලින් ඉවත්වන ඉඳුල් සහ අනෙකුත් අපද්‍රව්‍ය	බන්ධනාගාර තුළ පවත්නා ඉඩකඩ ආදී ගැටලු සම්බන්ධයෙන් ද සලකා බලමින් මෙම ක්‍රමවේදයන් සිදු කිරීමට අවශ්‍ය උපදෙස් බන්ධනාගාර ආයතනවලට ලබාදීමට පියවර ගනිමින් සිටී.	අපද්‍රව්‍ය කළමනාකරණය මගින් අමතර ආදායමක් ලබාගැනීමට කටයුතු කළ යුතු ය.

	භාවිතයෙන් කොම්පෝස්ට් පොහොර සෑදීමේ ව්‍යාපෘතියක් ආරම්භකර අමතර අලෙවි අදායමක් ලබාගත හැකි වුව ද, බන්ධනාගාර ආයතන 04ක් හැර අනෙකුත් බන්ධනාගාරවල එවැනි ක්‍රමවේදයක් නොතිබුණි.		
(ඒ)	බන්ධනාගාර මගින් ළමා සැකකරුවන් ළමා නිවාස වෙත යැවීමට සිදුවන අවස්ථා සහ රෝහල් ආරක්ෂණ හා අධිකරණ නියෝග මත වෙනත් අධිකරණ වෙත පසුදිනම ඉදිරිපත් කිරීමට (AR) නියෝගකර ලබාදෙන එක් රැඳවියෙකු හෝ දෙතුන්දෙනෙකු පමණක් ඊට අදාළ බන්ධනාගාර හෝ අදාළ අධිකරණ වෙත රැගෙන යා යුතු අවස්ථාවල දී බන්ධනාගාර බස්රථ යොදාගැනීමට සිදුවීම, ප්‍රවාහන වියදම් අධික තත්ත්වයක් පවතින බවත්, මෙම ආරක්ෂණ රාජකාරී සඳහා ඉන්ධන පිරිවැය අඩු වාහනයක් (වෑන් රථයක්) යොදාගැනීමත්, පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව ළමා සැකකරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමත් මගින් ඉන්ධන පිරිවැය අඩුකරගත හැකි වේ. පොළොන්නරුව බන්ධනාගාරය විසින් 2024 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල වරකට කිලෝමීටර් 150 හා ඊට වැඩිදුරක් ආරක්ෂණ රාජකාරී සඳහා බස්රථ යොදාගත් අවස්ථා 25කදී කිලෝමීටර් 6,737ක් සඳහා ඉන්ධන පිරිවැය ලෙස රු.432,604ක වියදමක් දරා තිබුණි.	මෙම කාර්යය බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අදාළ කටයුත්තක් නොවන අතර, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට අයත් කටයුත්තක් වේ. එනමුත් ඉදිරියේ දී සිරකරුවන් රැගෙන යාමට වෑන් රථ 10ක් පමණ ගැනීමට සැලසුම්කර ඇති අතර, අවස්ථානුකූලව ඉහත කටයුත්ත සඳහා අවශ්‍යතාවය පරිදි වාහන පහසුකම් සපයාදීම සම්බන්ධයෙන් සලකා බැලිය හැකි බව කාරුණිකව දන්වමි.	ආරක්ෂණ රාජකාරී කටයුතුවල දී වියදම් කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතු ය.
(ඔ)	2019 මාර්තු 29 දින සහ 2023 ජුනි 09 දින පැවති රාජ්‍ය ගිණුම්කාරක සභාව මගින් ලබාදෙන ලද නියෝග ප්‍රකාරව 1877 අංක 16 දරන බන්ධනාගාර ආඥා පනත වෙනුවට නව පනතක් සකස් කිරීමේ කටයුතු ද 2024 දෙසැම්බර් 31 දින දක්වා අවසන්කර නොතිබුණි.	මේ වන විට නව පනත සැකසීමේ කටයුතු සිදුකෙරෙමින් පවතින බව දන්වමි.	නව පනත සැකසීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතු ය.
(ඕ)	1974 ජුනි 07 දිනැති බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අංක 634 චක්‍රලේඛයට අනුව වසර 02ක් හෝ ඊට වැඩි කාලයක් දඬුවම් ලබා දඬුවමින් වසරකට අඩුකාලයක් ගෙවීමට ඇති සිරකරුවන් වැඩසහන ක්‍රමය යටතේ	දැනට බන්ධනාගාරගත කරනු ලබන රැඳවියන්ගෙන් බහුතරයක් කෙටිකාලීන සිරකරුවන් බැවින් ද 1997 මැයි 16 දිනැති බන්ධනාගාර කොමසාරිස් චක්‍රලේඛ 31/77 ප්‍රකාරව සුදුසුකම්ලත් සිරකරුවන්	වැඩසහන ක්‍රමය සහ කෙටිකාලීන ක්‍රමයට අදාළ චක්‍රලේඛ යාවත්කාලීනකර එම ක්‍රමවේදයන්

	ආයතනවල සේවයේ යෙදවීමට අවස්ථාව ලබා දී තිබුණ ද, 2024 වර්ෂය තුළ බන්ධනාගාර ආයතන 02කින් රැඳවියන් 162ක් රජයේ ආයතන 03ක් වෙත පමණක් සේවයේ යොදවා ඉපයූ ආදායමෙන් රු.278,572ක් රජයේ ආදායමට ද, රු.1,392,860ක් සිර වේතන ලෙස සිරකරුට ද, රු.139,286ක් සිරකරු සුභසාධක අරමුදලට ද බැරකර තිබුණි. තව ද, කෙටිකාලීන ක්‍රමය යටතේ අවුරුදු එකක් හෝ ඊට අඩුකාලයක් සඳහා සිරගත වූවන් ද සේවයේ යෙදවීමට අවස්ථාව ලබා දී තිබුණ ද, එම ක්‍රමය ක්‍රියාත්මකකර නොතිබුණි. සියලුම බන්ධනාගාර ඒකාබද්ධව රජයේ හා පෞද්ගලික අංශයේ ආයතනවල ද රැඳවියන් සේවයේ යෙදවීමෙන් බන්ධනාගාර තදබදය අවම කිරීම මෙන්ම රැඳවියන් පුනරුත්ථාපන ක්‍රමයක් ලෙස ද උපයෝගීකර ගැනීමේ හැකියාව පැවතුණ ද මෙම ක්‍රම දෙක යටතේ සිරකරුවන් විධිමත් පරිදි පිටත සේවයේ යොදවා නොතිබුණි.	ආයතනවල නොමැතිවීම ද මේ සඳහා හේතු වී ඇති බව වාර්තා කරමි. වැඩසහන සේවය මත රැඳවියන්ගේ සේවය ලබාගැනීමට එම ආයතනවලින් ඉල්ලීමක් කළ යුතු ය. මේ සම්බන්ධව දැනුවත් කිරීමට 2023 ජුනි 12 දිනැති දිනමිණ පුවත්පත් නිවේදන ද නිකුත්කර ඇතත්, එවැනි ඉල්ලීම් සිදුකර ඇත්තේ ආයතන කිහිපයක් පමණි.	සක්‍රීය කිරීමට පියවරගත යුතු ය.
(ක)	2024 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුළ සිර/සැක අනුමත ධාරිතාව 10,395ක් වුව ද, එදිනට තථ්‍ය ධාරිතාවය 28,278ක් වීමෙන් රැඳවියන් 17,883ක් ධාරිතාවය ඉක්මවා බන්ධනාගාර පද්ධතිය තුළ රඳවා තිබූ අතර, එය සියයට 272ක ඉහළ යාමක් ලෙස පැවතුණි. තව ද, 2025 මැයි 29 දින වන විටත් කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය තුළ රැඳවිය හැකි රැඳවි ධාරිතාවය 465ක් වුව ද, එදිනට තථ්‍ය ධාරිතාවය 2,206ක් වීමෙන් රැඳවියන් 1,741ක් ධාරිතාවය ඉක්මවා රඳවා තිබූ අතර, එය සියයට 474ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.	සෑමවිටම එක්සත් ජාතීන්ගේ ප්‍රමිතීන්ට අනුව හා බන්ධනාගාර ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව සිරකරුවන් හා සැකකරුවන් රැඳවීමේ මූලධර්ම ආරක්ෂා කිරීමටත්, වර්ගීකරණයන් අනුව රැඳවීමටත් අවශ්‍ය කටයුතු සිදු කිරීමට උපරිම උත්සාහයක් ගන්නා බව විගණනය වෙත දන්වා සිටින අතර, වෙනත් නඩු කටයුතු ඇති රැඳවියන් අධිකරණ වෙත ඉදිරිපත් කිරීමේ පහසුව තකා එම අධිකරණයන්ට ආසන්න බන්ධනාගාර තුළ රඳවා ඇති බැවින්, ඉඩකඩ සහිත වෙනත් බන්ධනාගාරයන් වෙත මාරුකිරීම සිදුනොකරනුයේ ඒ සඳහා අමතර පිරිවැයක් ද දැරීමට සිදුවන නිසා බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.	බන්ධනාගාර තුළ තථ්‍ය ධාරිතාවය ඉහළ නැංවීම සඳහා ගොඩනැගිලි පහසුකම් වර්ධනය කිරීමට කටයුතු කළ යුතු ය.

(ග) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ වාහන උපයෝජනය පරීක්ෂාවේ දී පහත කරුණු හෙළිදරව් විය.		
(i) 2024 දෙසැම්බර් 31 දින වන විට බන්ධනාගාර ආයතන 07ක වාහන 08ක් තෙවන පාර්ශවයේ රක්ෂණයක් හෝ සිදුනොකර ධාවනයේ යොදවා තිබුණි.	මේ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය කටයුතු කිරීමට නියමිත ය.	මෝටර් වාහන පනත අනුව සියලුම වාහන රක්ෂණයකර ධාවනය කිරීමට කටයුතු කළ යුතු ය.
(ii) විගණනය විසින් සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව බන්ධනාගාර ආයතන 11ක වාහන 26ක් දැනට භාවිතා කරන නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විට වායු විමෝචන සහතිකය ලබාගෙන නොතිබුණි.	මෙම අඩුපාඩු නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වා සිටිමි.	සියලුම වාහන සඳහා වායු විමෝචන සහතිකය ලබා ගැනීමට කටයුතු කළ යුතු ය.
(iii) අනුරාධපුර, යාපනය, වැලිකඩ, මොණරාගල, කුරුවිට, මාතර සහ වීරවිල යන බන්ධනාගාර ආයතන 07ක වාහන 20ක මයිලෝ මීටර 2024 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණි.	මෙම අඩුපාඩු නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වා සිටිමි.	අක්‍රීය වූ මයිලෝ මීටර් අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු ය.
(iv) බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් රජයේ වෙනත් ආයතන සතු මෝටර් වාහන 14ක් පරිහරණය කරන අතර මෙම මෝටර් වාහන 2025 අප්‍රේල් 28 දින දක්වා පවරාගෙන නොතිබුණි.	මෙම අඩුපාඩු නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වා සිටිමි.	බන්ධනාගාරය සතු වාහන සුදුසු පරිදි පවරාගැනීමට කටයුතු කළ යුතු ය.
(ඡ) මත්ද්‍රව්‍ය වැරදි වැඩිවීම රටේ අනෙකුත් අපරාධ ක්‍රියාකාරකම් වැඩිවීමට සෘජුවම බලපාන අතර, මත්ද්‍රව්‍ය වැරදිකරුවන්ගෙන් බොහෝමයක් මත්ද්‍රව්‍ය භාවිතය, සන්තකයේ තබා ගැනීම, මිලදීගැනීම, විකිණීම සම්බන්ධයෙන් බන්ධනාගාරගත වූවන් වේ. ඔවුන් කවර හෝ ආකාරයකින් අවශ්‍ය මත්ද්‍රව්‍ය ප්‍රමාණය ලබාගැනීමට කරන උත්සාහයන් වැළැක්වීමට බන්ධනාගාර නිලධාරීන්ට වැඩි අවධානයක් යොමුකිරීමට සිදුවන නිසා බන්ධනාගාර ප්‍රධාන අරමුණු කරා ළගාවීමට, බන්ධනාගාරයේ ආරක්ෂාව, නිලධාරීන්ගේ ආරක්ෂාව හා	මේ සම්බන්ධයෙන් මීට අදාළ අනෙකුත් බාහිර ආයතන ද සම්බන්ධකර ගනිමින් සාකච්ඡාකර අවශ්‍ය කටයුතු කිරීමට නියමිත ය.	කාලීන අවශ්‍යතාවයට ගැළපෙන පරිදි රැඳවියන් යහපත් පුරවැසියන් ලෙස පිටත්වීමට අවශ්‍ය සමාජ පසුබිම සැකසීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් අතරින් එකක් වන බැවින් ඊට අදාළ රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය වෙමින් විධිමත් පරිදි

	ක්‍රියාකාරීත්වයට බාධාවක් වී ඇත. ලංකාවේ 2024 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය වැරදි මත සිරගතවූවන් සංඛ්‍යාව 31,314ක් වූ අතර, සැකකරුවන් සංඛ්‍යාව 67,117ක් විය. 2024 වර්ෂය තුළ බන්ධනාගාරය වෙත සෘජු ඇතුළත් කිරීම්වලින් සියයට 65.5ක් මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධ රැඳවියන් විය.		කටයුතු කළ යුතු ය.
(ට)	විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය සඳහා පුනරුත්ථාපන කාර්යාංශය මගින් පවත්වාගෙන යනු ලබන කන්දකාඩු, සේනපුර හා වවුනියාව ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල 1,120ක් පුනරුත්ථාපනය කළ හැකි වුව ද , 2024 දෙසැම්බර් 31 දිනට ධාරිතා උපයෝජනය 262ක් විය. ඒ අනුව තවදුරටත් 858දෙනෙක් සඳහා මෙම පුනරුත්ථාපන මධ්‍යස්ථානවල පහසුකම් පැවතුණ ද, එම මධ්‍යස්ථාන ඌණ උපයෝජිතව පැවතුණි. තව ද, 2024 වර්ෂය තුළ මෙම මධ්‍යස්ථාන 03 සඳහා යොමුකළ ගණන 642ක් තරම් අඩු ප්‍රමාණයක් වූ අතර, බන්ධනාගාර තදබදයට පිළියමක් ලෙස මෙන්ම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ රැඳවියන් පුනරුත්ථාපනයකර සමාජගත කිරීමේ හැකියාව ද සලසා සෘජුවම මෙම මධ්‍යස්ථාන වෙත අධිකරණයෙන් යොමුකිරීම වෙනුවෙන් අවශ්‍ය පසුබිම බන්ධනාගාර දෙපාර්තමේන්තුව, අධිකරණ සේවා කොමිසම, අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය එකතුව සිදුකිරීමේ අවශ්‍යතාවයක් පැවතිය ද, එම ආයතන එපරිදි කටයුතු කර නොතිබුණි.	මෙය උසාවි නියෝග මත අධිකරණය මගින් සිදුකරනු ලබන ක්‍රියාවලියකි. ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් අදාළ ආයතන සමග සාකච්ඡාකර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	අදාළ ආයතන සමග සාකච්ඡාකර පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත යොමුකර බන්ධනාගාර තදබදය අඩු කිරීමට පියවරගත යුතු ය.
(ඩ)	සිරකරුවන් විධිමත් පරිදි පුනරුත්ථාපනය කිරීමට නොහැකි වූ විට ඔවුන් නැවත නැවත බන්ධනාගාරගත වන අතර, ඉන් වැඩි පිරිසක් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් නිසා ඔවුන් සඳහා නිසිප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක නොවීම තුළින් නැවතත් මත්ද්‍රව්‍ය භාවිතාකර සිරගතවීම සිදු වේ. 2024 වර්ෂය තුළ බන්ධනාගාර වෙත සෘජු ඇතුළත් කිරීම් තුළින් නැවත නැවත	නැවත නැවතත් සිරගතවන පුද්ගලයන් නිවැරදිව හඳුනාගනු පිණිස ජෛවමිතික පද්ධති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට නියමිත ය.	බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය (PIMS) මගින් මෙම තොරතුරු යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතු ය.

සිරගත වූවන් සංඛ්‍යාව 34,488 ක් වන අතර, ඔවුන් හඳුනාගැනීමට විධිමත් ක්‍රමවේදයක් පවා බන්ධනාගාරය සතුව නොමැතිවීමත්, දැනට නැවත නැවත සිරගතවන සිරකරුවන් හඳුනාගනු ලබන්නේ එම සිරකරුවන් විසින්ම ලබාදෙන වාචික තොරතුරු මත වේ.		
(ඍ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම් පරීක්ෂාවේ දී පහත කරුණු හෙළිදරව් විය.		
(i) අත්තිකාරම් "බී" ගිණුමේ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2024 ජනවාරි 01 දිනට අයවිය යුතු කේවල ශේෂවල මුළු වටිනාකම රු.209,504,062ක් විය. එයින් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ අයවිය යුතු ණයශේෂය හැර නිලධාරීන් 231 දෙනෙකුගෙන් අයකර ගත යුතු හිගහිටි ණයශේෂය රු.10,782,944ක් වූ අතර, එයින් නිලධාරීන් 106දෙනෙකුගේ රු.4,572,791ක හිගහිටි ණය ශේෂයක් 2024 වර්ෂය තුළ අයකරගෙන තිබුණු අතර, 2024 වර්ෂයේ දී නිලධාරීන් 71 දෙනෙකුගේ රු.3,548,024ක වටිනාකමක් හිඟහිටි ණය ශේෂයට අළුතින් එකතු වී ඇත. ඒ අනුව වර්ෂය අවසන් වන විට තවදුරටත් නිලධාරීන් 196 දෙනෙකුගෙන් රු.9,758,177ක හිගහිටි ණයශේෂයක් අයකරගත යුතුව තිබුණි.	මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.	හිඟ ණයශේෂ අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු ය.
(ii) සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කේවල ශේෂවල මුළු වටිනාකම රු.240,005,072ක් විය. එයින් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ අයවිය යුතු ණයශේෂය හැර සමාලෝචිත වර්ෂයේ අවසානයේ අයවිය යුතු ණයශේෂය රු.10,170,334කි.	මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.	හිඟ ණයශේෂ හඳුනාගෙන කඩිනමින් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු ය.

	(iii) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් “බී” ගිණුමට අදාළව 2023 වර්ෂයේ දී ඉදිරිපත් කළ වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ වසර 3කට වඩා වැඩි කාලයක සිට පැවත එන එහෙත් අයකරගත යුතු පාර්ශවය නිශ්චිතව හඳුනාගෙන නොමැති රු.401,153ක ණයශේෂයක් එම මූල්‍ය ප්‍රකාශන විගණනයේ දී හඳුනාගෙන තිබුණි. පසුගිය වර්ෂයන්හි දී හඳුනාගෙන නොමැති එහෙත් වර්ෂ 5 ඉක්මවන ලද රු.11,004ක ශේෂයක් ද 2024 වර්ෂයේ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් “බී” ගිණුමට ඇතුළත්කර තිබුණි.	මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.	හිඟ ණයශේෂ හඳුනාගෙන කඩිනමින් අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු ය.
(ත)	එක්සත් ජාතීන්ගේ අවම ප්‍රමිතීන් අනුව ස්ත්‍රී/ පුරුෂභාවය, වයස, අපරාධයේ ස්වභාවය, නීතිමය අවශ්‍යතා හා ප්‍රතිකාරමය අවශ්‍යතා අනුව සිරකරුවන් වර්ගීකරණයකර වෙන වෙනම රැඳවීම අත්‍යාවශ්‍ය මූලධර්මයක් ලෙස සඳහන් වන අතර, බන්ධනාගාර ආඥාපනතේ 54 ඡේදයට අදාළව 1956 වර්ෂයේ දී සිදුකරන ලද සංශෝධනයන්හි 177 හා 178 ඡේදයට අනුව බන්ධනාගාරයේ ඉඩපහසුකම් ඇති ආකාරයට එක් එක් වර්ගයට අයත් සිරකරුවන් වෙන වෙනම රඳවා තබා ගත යුතු වුව ද, දැනට ආයතන තුළ පවතින අධික තදබදය හේතුවෙන් බන්ධනාගාර ආයතන 18ක එසේ වර්ග කිරීමකින් තොරව රැඳවියන් රඳවා තිබුණි.	මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකිරීමට නියමිත ය.	පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව හා බන්ධනාගාර ආඥාපනතේ විධිවිධානයන්ට අනුව කටයුතු කළ යුතු ය.
(ථ)	2024 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර ආයතන 27ක සුළු දඩමුදල් ගෙවා ගැනීමට නොහැකිව බන්ධනාගාරගත වී ඇති සිරකරුවන් සංඛ්‍යාව 3,258ක් බව හෙළිදරව් වූ අතර, පවතින බන්ධනාගාර තදබදයට මෙම තත්ත්වය හේතුවක් වී තිබුණි.	නිරීක්ෂණය සමග එකඟ වෙමි.	සුදුසු සමාවක් යටතේ නිදහස් කිරීමට පියවරගත යුතු ය.
(ද)	අධිකරණ මගින් බන්ධනාගාරගතකර ඇති සැකකරුවන්ට අදාළව පොලීසිය විසින් රසපරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන නඩු	නිරීක්ෂණය සමග එකඟ වෙමි.	අදාළ ආයතන සමග සම්බන්ධීකරණයවී රසපරීක්ෂක වාර්තා කඩිනමින්

	භාණ්ඩවලට අදාළව රසපරීක්ෂක වාර්තා ඉදිරිපත් නොවීම නිසා 2024 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර ආයතන 20ක සැකකරුවන් 9,560 දෙනෙක් රඳවා තිබුණි.		ලබාගැනීම මගින් සැකකරුවන්ට අදාළ ක්‍රියාමාර්ග ගැනීම විධිමත් කළ යුතු ය.
(ධ)	බන්ධනාගාර ආයතන 10ක අභියාචනා ඉදිරිපත් කළ දිනයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා පරීක්ෂණ අවසන්කර නොමැති අභියාචනා සංඛ්‍යාව 333ක් විය.	මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකිරීමට නියමිත ය.	අදාළ ආයතන සමග සම්බන්ධීකරණය වී අභියාචනා කඩිනමින් නිරවුල් කිරීමට අදාළ කටයුතු සම්පාදනයකර දිය යුතු ය.
(න)	ඇපමුදල් ගෙවීමට නොහැකි සැකකරුවන් බන්ධනාගාරගත කරන අතර, එම සැකකරුවන් ඇපමුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද වහාම ඔවුන් නිදහස්කළ යුතු ය. එහෙත් බන්ධනාගාර ආයතන 11ක 2024 වර්ෂය තුළ ඇපමුදල් ගෙවූ දිනයෙන් පසු දිනක අවස්ථා 9,091ක දී සැකකරුවන් නිදහස්කර තිබුණි.	ඇප ලබාදීමෙන් පසු දීර්ඝ කාලයක් රඳවාගෙන නොසිටින අතර, ඇප නියම කිරීමෙන් අනතුරුව අධිකරණය තහවුරු කළ පසු අදාළ නිදහස් කිරීම සිදුකළ යුතු අතර, ඇතැම් අවස්ථාවන්හි සිකුරාදා දින අධිකරණ නියෝගය නිකුත් කළහොත් ඊළඟ සඳුදා දින නිදහස් කිරීමට සිදුවේ.	ඇපමුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද දිනයේම සිරකරුවන් සිර දඬුවමින් නිදහස් කිරීමට කටයුතු කළ යුතු ය.
(ප)	දඩමුදල් ගෙවීමට නොහැකි වරදකරුවන් සිරගත කරන අතර, එම සිරකරුවන්ගේ දඩමුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද වහාම ඔවුන් සිරදඬුවමින් නිදහස් කළ යුතු ය. නමුත් බන්ධනාගාර ආයතන 17ක 2024 වර්ෂය තුළ නිදහස් කිරීමේ නියෝගය ලද දිනයේම සිරදඬුවමින් මුදාහැර නොතිබුණු අවස්ථා 2,278ක් විය.	දඩමුදල් ගෙවීමෙන් පසු දීර්ඝ කාලයක් රඳවාගෙන නොසිටින අතර, දඩමුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද වහාම නිදහස් කිරීම සිදුකළ යුතු අතර, ඇතැම් අවස්ථාවන්හි සිකුරාදා දින අධිකරණ නියෝගය නිකුත් කළහොත් ඊළඟ සඳුදා දින නිදහස් කිරීමට සිදුවේ.	නිදහස් කිරීමේ නියෝගය ලද වහාම සිරකරුවන් සිරදඬුවමින් නිදහස් කිරීමට කටයුතු කළ යුතු ය.
(ඵ)	බන්ධනාගාර ආයතන 21කට අදාළව බන්ධනාගාරගත වී ඇති රැඳවියන් වෙනුවෙන් අධිකරණය මගින් ඇප නියම වී තිබුණ ද, අදාළ රැඳවියන් හට ඇප කොන්දේසි සපුරාලීමට නොහැකිවීම ඇප තැබීමට ඥාතීන් ඉදිරිපත් නොවීම, මුදල් නොමැතිකම වැනි හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට බන්ධනාගාරගත වී සිටින රැඳවියන් සංඛ්‍යාව 1,252ක් වන අතර, එයින් ඇප නියම වී වසර එකට වඩා වැඩි රැඳවියන් 55ක් විය.	ඇප තැබීමට ඥාතීන් ඉදිරිපත් නොවීම, මුදල් නොමැතිකම සහ ඇප කොන්දේසි සපුරාලිය නොහැකිවීම වැනි හේතු මෙයට බලපා ඇත.	අදාළ ආයතන සමග සම්බන්ධීකරණය වී ඇප කොන්දේසි ලිහිල්කර ගැනීමට විධිමත් පියවරගත යුතු ය.

(බ)	බන්ධනාගාර ආයතන 20ක් තුළින් 2024 දෙසැම්බර් 31 දිනට අත්අඩංගුවට ගන්නා ලද ජංගම දුරකථන 3,738ක්, බැටරි 3,229ක්, චාජර් 524ක් හා සිම්පත් 2,999ක් වන අතර, මෙම උපකරණ බන්ධනාගාර රැඳවියන් අතට පත්නොවීමට විධිමත් පියවරගත යුතු බවත්, රැඳවියන් අතට පත්වීම හේතුවෙන් විවිධ නීතිවිරෝධී ක්‍රියාවන් සිදුවන බවත් හෙළිදරව් විය.	මෙම නීති විරෝධි ක්‍රියාවන් උපරිමයෙන් පාලනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වා සිටිමි.	තහනම් භාණ්ඩ බන්ධනාගාර රැඳවියන් අතට පත් නොවීමට විධිමත් ආරක්ෂක පියවරගත යුතු ය.
(භ)	අගුණකොළපැලැස්ස පුහුණු පාසලේ 2024 ජුනි සිට නොවැම්බර් දක්වා කාලය තුළ පැවැත් වූ පුහුණු සැසි 11කට සහභාගී වූ නිලධාරින්ගේ සංඛ්‍යාවට වඩා වැඩි නිලධාරින් සංඛ්‍යාවක් සඳහා ආහාරපාන ලබාදීම වෙනුවෙන් රු.203,495ක් වැඩිපුර ගෙවා තිබුණි.	අභ්‍යන්තර විගණන නිර්දේශ අනුව ඉදිරි කටයුතු කරනු ඇත.	පුහුණු සැසිවලට සහභාගිවන නිලධාරින්ට ආහාර ලබාදීමේ දී විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර ගත යුතු ය.
(ම)	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වන සුහසාධන ආපනශාලා සහ අලෙවිසැල්වල සේවය කිරීම සඳහා දෙපාර්තමේන්තු නිලධාරින් අනුයුක්ත කර තිබූ අතර, ඔවුන් වෙත වැටුප්, අතිකාල හා අනෙකුත් දීමනා ගෙවනු ලබන අතර, ජල හා විදුලිය වෙනුවෙන් ද වැය වන වියදම බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් දරනු ලබයි. මීට අමතරව සෑම ආපනශාලාවක් සඳහාම සිරශ්‍රමය ද යොදාගෙන තිබුණි. නමුත් මෙම සුහසාධන ආපනශාලා සහ අලෙවිසැල් පවත්වාගෙන යාම වෙනුවෙන් ලැබිය යුතු කුලී ආදායම් හඳුනාගෙන එම ආදායම් මුදල් රෙගුලාසි 83 ප්‍රකාරව රජයේ ආදායම් ශීර්ෂ අංක 05හී ආදායම් සංකේත අංක 20-02-01-01 යටතේ බදුකුලී ආදායම් ලෙස රජයේ ආදායමට බැරකිරීමට කටයුතු කළ යුතු වුව ද, බූස්ස, මඩකළපුව, තල්දෙන, වීරවිල, වවුනියාව, බන්ධනාගාර මූලස්ථානය හා හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය යන බන්ධනාගාර ආයතනවල ඇති සුහසාධක ආපනශාලාවලින් බදුකුලී ආදායම් රජයේ ආදායමට බැරකර නොතිබුණි. මෙම සුහසාධන ආපනශාලා සහ අලෙවිසැල්වලට 2024 වර්ෂය තුළ අනුයුක්ත බන්ධනාගාර	බන්ධනාගාර ආයතනවල ආරක්ෂාව පවත්වා ගැනීමට සහ පිටත අය යෙදවීමෙන් විශාල මුදලක් වැයවීම යන කරුණු හේතුවෙන් බන්ධනාගාර නිලධාරින් අදාළ කටයුතු සඳහා යොදවා ඇත.	මුදල් රෙගුලාසි 83 ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

	නිලධාරීන් වෙනුවෙන් වැටුප්, අතිකාල හා වෙනත් දීමනා වශයෙන් රු.12,944,077ක මුදලක් බන්ධනාගාර දෙපාර්තමේන්තුව ගෙවා තිබුණි.		
(ය)	බන්ධනාගාර ආයතන 16ක 2024 දෙසැම්බර් 31 දින වන විට ගිනිඅවි 239ක් අක්‍රීය වී තිබුණු අතර, බන්ධනාගාර ආයතන 09ක තිබූ ගිණිඅවි 70ක්, මැගසින් 51ක් හා පතුරොම් 1,021ක් විමර්ශන කටයුතු සඳහා අධිකරණ හා පොලිස් ස්ථාන වෙත භාර දී අවුරුදු 02ත් අවුරුදු 30ත් අතර කාලපරාසයක් ගත වී තිබුණ ද, 2025 අප්‍රේල් 28 දින දක්වා විධිමත් පරිදි නැවත ලබාගෙන නොතිබුණි. ගිනිඅවි අක්‍රීය වී පැවතීම හා විවිධ විමර්ශන සඳහා අධිකරණ හා පොලිස් භාරයේ පැවතීම හේතුවෙන් ආයතනයේ අධිකරණ රාජකාරී, විශේෂ රෝහල් රාජකාරී, ආරක්ෂණ රාජකාරී හා යම් කළහකාරී අවස්ථාවක දී එය පාලනය කිරීමට සම්බන්ධවීමේ දී බන්ධනාගාර නිලධාරීන්ට යම් ගැටළුකාරී තත්ත්වයක් මතුවිය හැකිව තිබුණි.	පවතින ගිනිඅවි ද යොදාගනිමින් කළමනාකරණයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකෙරේ.	ගිනිඅවි සඳහා විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර ගත යුතු ය.
(ර)	බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමේ රාජ්‍ය අංශයට සිදු කරන ලද විකුණුම් වෙනුවෙන් ලැබිය යුතු රු.170,560,476ක ශේෂයෙන් වසර 20කට වඩා පැරණි රු.3,000,924ක් හා වසර 5 – 20ත් අතර රු.23,020,150ක ලැබිය යුතු ශේෂය මුදල් රෙගුලාසි 502(ආ) ප්‍රකාරව අප්‍රමාදව අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.	කමිටුවක් මගින් මේ සම්බන්ධව සොයා බලා අවශ්‍ය කටයුතු කිරීමට නියමිත ය.	මුදල් රෙගුලාසි 502(ආ) ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ල)	බන්ධනාගාර ආයතන තුළ සවිකර ඇති දුරකථන සංඥා බාධක පද්ධතිය (Jammers) සම්බන්ධයෙන් පරීක්ෂාවේ දී පහත කරුණු හෙළිදරව් විය.		
	(i) 2023 ජුනි 09 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දී ලබාදුන් නියෝග අනුව "සිරකරුවන්ට ආරක්ෂාව හා රැකවරණය සලසමින් ඔවුන් පුනරුත්ථාපනයකර සමාජගත	2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා සංඥා බාධක සවිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර නොමැති අතර, 2025 ජුනි 11 දිනැතිව අනුමත 2025 ක්‍රියාකාරී සැලැස්මට අනුව බන්ධනාගාර ආයතන 15ක් සඳහා	රාජ්‍ය ගිණුම්කාරක සභාවේ දී සාකච්ඡා කර එකඟ වූ කරුණු ක්‍රියාත්මක කිරීමට පියවරගත යුතු ය.

	කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ" නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම සමග ඉදිරිපත් කර තිබූ බන්ධනාගාර ආයතන සඳහා අවශ්‍ය නවීන තාක්ෂණ ආරක්ෂක උපකරණ ලබා ගැනීමේ ව්‍යාපෘති යෝජනාවේ ජැමර් යන්ත්‍ර මිලදීගැනීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරිමට යෝජනා වී තිබුණි. ඒ අනුව ප්‍රථම අදියරේ ජැමර් යන්ත්‍ර 09ක් 2024 – 2025 වර්ෂ 02ක තුළ ලබාගැනීමට සැලසුම්කර තිබුණ ද, ඒ සඳහා විධිමත් ලෙස පියවර ගෙන නොතිබුණි.	සංඥා බාධක සවිකිරීම සඳහා රුපියල් මිලියන 165ක් වෙන් වී ඇත. ඒ අනුව බන්ධනාගාර ආයතනවල සංඥා බාධක පද්ධතිය සවිකිරීම සඳහා ආයතනවල භූමියේ වර්ගඵලයන් ගෙන්වා ආරක්ෂක පරීක්ෂණ මධ්‍යස්ථානය වෙත යොමුකර ඇති අතර, එම වර්ගඵලයන් අනුව ඇස්තමේන්තු වාර්තා ලබාගැනීමෙන් පසු ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය පියවරයන් ගැනීමට නියමිත ය.	
(ii)	ජැමර් පද්ධතිය ස්ථාපිතකර ඇති බන්ධනාගාර ආයතනවල එම පද්ධති හේතුවෙන් කාර්යාලයේ සියලුම රැහැන් රහිත දුරකථන පද්ධතිය අක්‍රියවීම, අන්තර්ජාල පහසුකම් නිසිපරිදි ක්‍රියාත්මක නොවීම, බන්ධනාගාර අවට රජයේ නිලනිවාස, රාජ්‍ය/පෞද්ගලික ආයතන හා පෞද්ගලික නිවාසවල දුරකථන සංඥා සඳහා බාධා පැමිණීම වැනි ගැටළු මතුව ඇත. ඒ සඳහා භාවිතාවන ජැමර් පද්ධති බන්ධනාගාර පවුරෙන් ඇතුළට සීමාවන පරිදි සකස්කිරීමත්, අවහිරතා පවතින පරිශ්‍ර ආවරණය වන පරිදි දුරකථන සංඥා ලබා දීමට කටයුතු කිරීම හා නවීන තාක්ෂණයෙන් යුතු යන්ත්‍ර හඳුන්වා දී මෙම ගැටළු මගහරවා ගැනීමට කටයුතු කළ යුතුව පැවතුණි.	දුරකථන සංඥා බාධක පද්ධතිය ස්ථාපනයකර ඇති ආයතනවල රැඳවියන්ගේ දුරකථන භාවිතය වැළැක්වීම අරමුණ වුව ද, රැඳවියන් ගැවසෙන ස්ථාන ඉලක්කකර ඇති වුවත්, මේ වන විට එහි ක්‍රියාකාරීත්වය මත කාර්යාල සඳහා භාවිතා වන දුරකථන අක්‍රියවීම සහ වෙනත් අත්‍යාවශ්‍ය කාර්ය සිදුවන රාජ්‍ය සහ පෞද්ගලික අංශ කෙරෙහි ඇති වන බලපෑම මග හරවා ගැනීමට සංඥා පද්ධති සවිකිරීමට භාරගෙන ඇති ආයතන වෙත එම තත්ත්වය සම්බන්ධයෙන් දැනුවත්කර ඇත.	බන්ධනාගාරයෙන් බාහිරව පවතින දුරකථන සම්බන්ධතා අක්‍රිය නොවන ආකාරයෙන් ජැමර් පද්ධතිය සවි කිරීමට පියවරගත යුතු ය.
(ච)	රැඳවි පරිපාලන කටයුතු වඩාත් විධිමත් හා කාර්යක්ෂමව ඉටුකිරීම උදෙසාත් රැඳවියන්ගේ තොරතුරු කළමනාකරණ පද්ධතිය ස්ථාපනයකර ක්‍රියාත්මක කිරීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ එක් ප්‍රධාන කාර්යයක් වන බැවින්, 2013 වර්ෂයේ දී ආරම්භකර තිබූ බන්ධනාගාර තොරතුරු		

කළමනාකරණ පද්ධතිය සඳහා 2024 වර්ෂය දක්වා රු.200,514,577ක් වැය කර තිබූ අතර, ඒ පිළිබඳ පරීක්ෂාවේ දී පහත කරුණු හෙළිදරව් විය.		
(i) නේවාසිකයන් සම්බන්ධ තොරතුරු කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණයකර ගැනීම සඳහා ස්ථාපිතකර ඇති මෙම බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය (PIMS) බන්ධනාගාර ආයතනයන් තුළ ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රධාන වශයෙන් සිරලියාපදිංචිය, සිරමාරු, සිරරැඳවුම්, විනය, කර්මාන්ත, පුනරුත්ථාපනය, සිරපුද්ගලික දේපළ කළමනාකරණය, අමුත්තන් පෙන්වීම, ප්‍රධාන දොරටුව, ආහාර වට්ටෝරු අංශය, සමා ලකුණු අංශය හා වෛද්‍ය අංශය ඇතුළුව එක් එක් අංශයන්වලට අදාළව දත්ත ඇතුළත් කළ යුතු වුව ද, විගණනයේ දී සිදුකළ පරීක්ෂාව අනුව සිරලියාපදිංචි, සිරමාරු හා සිරරැඳවුම් යන අංශවල දත්ත ඇතුළත් කිරීමේ කාර්යයන් සෑම බන්ධනාගාර ආයතනයක් විසින්ම සිදුකරන බව නිරීක්ෂණය වූ අතර, අනෙකුත් අංශවල දත්ත නිසිපරිදි යාවත්කාලීන වී නොතිබුණි.	තොරතුරු තාක්ෂණ අංශය මගින් බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමත්, තාක්ෂණික සහාය ලබාදීමත් සිදුකරනු ලබයි. ඒ අනුව පද්ධතියට ඇතුළත් ආහාර වට්ටෝරු, අභියාචනා තොරතුරු ඇතුළත් කිරීම හා සෞඛ්‍ය තොරතුරු ඇතුළත් කිරීම යන අංශයන් හැර අනෙකුත් සියලු අංශයන් ආරම්භ කිරීමට අවශ්‍ය පහසුකම් (පරිගණක හා ඒ ඒ අංශයන් සඳහා නිලධාරි පුහුණුව) සපයා දී ඇත.	බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය විධිමත්ව පවත්වා ගැනීමට කටයුතු කළ යුතු ය.
(ii) 2023 ජූනි 09 වන දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දී ද ජීවමිතික දත්ත පද්ධතිය පිළිබඳව අවධාරණය කර තිබූ අතර, එම නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධව 2023 ඔක්තෝබර් 25 දින අංක MOJ/AC/37/11-1/2023 දරන අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් රජයේ ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත්කර තිබූ රජයේ ගිණුම් කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, ඊට අදාළ ක්‍රියාකාරී	කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළ නමුත් ඒ සඳහා අනුමැතිය නොලැබීම හේතුවෙන් UNDP ආයතනයේ මූල්‍ය දායකත්වයෙන් ඉටුකර ගැනීමට එකඟතාවයකට පැමිණ ඇත.	බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය විධිමත්ව පවත්වා ගැනීමට කටයුතු කළ යුතු ය.

	සැලැස්ම සහ කාලරාමුව අනුව 2025 වර්ෂය තුළ ජීවමිතික දත්ත පද්ධතියක් හා ඊට අදාළ ජීවමිතික පරිලෝකන යන්ත්‍ර 150ක් සපයා ගැනීම සඳහා කටයුතු සිදුකිරීමට හා 2023 – 2025 කාලපරිච්ඡේදය තුළ යටිතල පහසුකම් හා දෘඪාංග පහසුකම් සැපයීමට සැලසුම්කර තිබුණ ද ඒ අනුව කටයුතුකර නොතිබුණි.		
(iii)	මෙම පද්ධතිය බාධාවකින් තොරව කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට පුහුණුව ලද මානව සම්පත අවශ්‍ය වන නමුත්, තොරතුරු පද්ධතිය ස්ථාපිතකර වසර 12ක පමණ කාලයක් ගතව තිබුණත් බන්ධනාගාර ආයතන 26ක නිලධාරීන් සඳහා ප්‍රමාණවත් හා විධිමත් පුහුණුවක් ලබා දී නොතිබුණු බවත්, වාර්ෂික ස්ථානමාරු කිරීම්වලදී පුහුණුව ලත් නිලධාරීන් මාරුකිරීම සම්බන්ධව විධිමත් අවධානයක් යොමුකර නොතිබුණි.	ඉදිරියේ දී බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය හා දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ කටයුතු සඳහා වෙන් වූ සේවා කාණ්ඩයක් යටතේ නිලධාරීන් බඳවාගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා සාකච්ඡා කොට එකඟතාවයකට පැමිණ ඇත.	බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය විධිමත්ව පවත්වා ගැනීමට කටයුතු කළ යුතු ය.
(iv)	බන්ධනාගාර ආයතනවල සේවය කරනු ලබන බන්ධනාගාර නියාමක නිලධාරීන් මෙම බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය ආශ්‍රිත කටයුතු සඳහා යොදවා ඇති නමුත්, ඔවුන්ගේ ප්‍රමුඛ රජකාරී කටයුතු වන උසාවි ආශ්‍රිත කටයුතු සඳහා ප්‍රමුඛ ස්ථානයක් ලබාදිය යුතු බැවින් තොරතුරු කළමනාකරණ පද්ධතිමය කටයුතු නිසියාකාරව යාවත්කාලීනවීමක් සිදුනොවීමට හේතු වී ඇති බව සහ අනුමත කාර්යමණ්ඩලයෙන් බැහැරව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරු 02ක් හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරු 39ක අවශ්‍යතාවය හඳුනාගෙන ඇති අතර, මේ සම්බන්ධව කළමනාකරණ සේවා	මෙම දෙපාර්තමේන්තුව සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරු 02ක් හා තොරතුරු හා සන්නිවේදන සහකාර තනතුරු 39ක් අනුමතකර ගැනීම සඳහා අදාළ පෝරම අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙත යොමුකර ඇති අතර, එම අමාත්‍යාංශය විසින් එම තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. නව තනතුරු අනුමත කළ වහාම බඳවාගැනීමට කටයුතු සිදු කරන අතර, මෙහි අවශ්‍යතාවය පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂක ජනරාල් සමග සාකච්ඡාවක් ද පවත්වා ඇත.	බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය විධිමත්ව පවත්වා ගැනීමට කටයුතු කළ යුතු ය.

	දෙපාර්තමේන්තුව වෙත දැනුවත් කර තිබුණ ද එම නව තනතුරු සඳහා මෙතෙක් බඳවාගැනීම් සිදු කර නොතිබුණි.		
(v)	අධික පිරිවැයක් දරා තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කරනු ලැබුව ද ජනාධිපති සමාවට අදාළ සමාව ගණනය කිරීම සහ ඊට අදාළ අනෙකුත් සියලු කටයුතු එක් එක් සිරකරුවන්ගේ වාර්තා පරීක්ෂා කර මැනුවෙල්(Manual) ක්‍රමවේදයක් මගින් සකස්කරනු ලබන අතර, ඒ සඳහා විශාල කාලයක් ගතවන බවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වගන්තිය අනුව ජනාධිපතිවරයාට ලැබී ඇති බලතල ප්‍රකාරව එක් එක් විශේෂ කරුණු යටතේ දඩුවම් විඳින සිරකරුවන් නිදහස් කිරීමට කටයුතු කිරීමේ දී ජනාධිපති සමාව සඳහා සුදුසුකම් ලබන සිරකරුවන් තෝරාගැනීම සහ එම සමාව සඳහා සුදුසුකම් ලබන සියලුම සිරකරුවන්ගේ නම් ලැයිස්තු ජනාධිපතිවරයාගේ අත්සන සඳහා යොමුනොකරන බැවින් මෙම ජනාධිපති සමා ක්‍රමවේදය සඳහා PIMS පද්ධතිය මගින් මොඩියුලයක් හඳුන්වාදීමේ හැකියාව තිබුණ ද ඒ සඳහා විධිමත් පියවරගෙන නොතිබුණි.	තොරතුරු කළමනාකරණ පද්ධතියක අවශ්‍යතාව සහ පිරිවිතර සකස්කිරීම සිදුකර ඇත්තේ 2014 වර්ෂයේ දී පමණ ය. එහිදී මෙම පද්ධතිය මගින් සිර/සැකකරුවන් බන්ධනාගාරයට ඇතුළත්වීමේ දී ලියාපදිංචිය, ඔවුන්ගේ පුනරුත්ථාපන වැඩසටහන්, ඔවුන්ගේ ආහාර වට්ටෝරු, සිර/සැක පැනයාම් හා මාරුකිරීම්, ආරක්ෂණ යැවීම්, විනය අංශ කටයුතු, අමුත්තන් පෙන්වීම සහ බලපත්‍ර මණ්ඩලයට ඉදිරිපත් කිරීම් කළමනාකරණයට අමතරව පුස්තකාල අංශ කටයුතු, නඩු කටයුතු යාවත්කාලීන කිරීම්, පුද්ගලික දේපළ ඇතුළත් කිරීම්, ප්‍රධාන දොරටුවේ ලේඛන කටයුතු සහ වෛද්‍ය වාර්තා සම්බන්ධ තොරතුරු ගබඩාකරණය යනා දී අංශ ඊට ඇතුළත්කර ඇත. සාමාන්‍ය සිරකරුවෙකුට කල්ක්‍රියාව හා යහපත් පැවත්මට හිමිවන ලකුණු ලබාදීමේ ක්‍රමවේදය අනුව පමණක් සමා සහිතව නිදහස් වන දිනය ස්වයංක්‍රියවම මෙම පද්ධතිය හරහා ලබාගත හැක. මෙම ක්‍රමය ආඥාපනතට අනුව සෑම සිරකරුවෙකුගේම වරප්‍රසාදයක් බැවින් එම පහසුව මෙම පද්ධතියෙන් පොදුවේ සෑම සිරකරුවෙකුටම ලැබෙන පරිදි PIMS තුළ අවශ්‍ය සැකසුම ලබා දී ඇත. ජනාධිපති සමාව යටතේ ලැබෙන සමාවන් එක් එක් කාලානුරූපීව වෙනස් වන බැවින් සහ එය වරදේ ස්වභාවය අනුව සෑම සිරකරුවෙකුටම ලැබෙන්නක් නොවන බැවින් ඒ පිළිබඳව සැකසීමක් මෙම (PIMS) පද්ධතිය අවශ්‍යතාවයන් හඳුනාගැනීමේ දී ඇතුළත්කර නොමැත. එසේ ම එය සංකීර්ණ කාර්යයක් වන බැවින්	බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතිය විධිමත්ව පවත්වා ගැනීමට අවශ්‍ය පියවරගත යුතු ය.

		ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික දුෂ්කරතාවයන් ද පවතී.	

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා අනුමත නිලධාරීන් ගණන 7,872ක් වූ අතර, තථ්‍ය වශයෙන් සේවයේ නියුක්ත නිලධාරීන් ගණන 6,082කි. ඒ අනුව එක් එක් මට්ටම් 4හි සියයට 20 වඩා නිලධාරීන් පුරප්පාඩු සංඛ්‍යාවක් සහිතව දෙපාර්තමේන්තුවේ කටයුතු කරයි.	කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2020 අනුව සියලු බඳවා ගැනීම් අත්හිටුවා ඇති අතර, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු සඳහා බහුකාර්ය සංවර්ධන සහායක පුහුණුලාභීන් බඳවාගැනීමට ලද අනුමැතිය අනුව සම්මුඛ පරීක්ෂණ හා ප්‍රායෝගික පරීක්ෂණ සමත් වූ නිලධාරීන් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රියදුරු, කාර්යාල කාර්ය සහයක, මුරකරු හා කම්කරු තනතුරු සඳහා බඳවාගැනීම සිදුකර ඇත. තවදුරටත් තිබෙන පුරප්පාඩු සම්පූර්ණකර ගැනීම සඳහා රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුතුව පත්කළ කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යාංශයට යොමුකර ඇත.	අදාළ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට පියවරගත යුතු ය.
(ආ)	අනුමත කාර්යමණ්ඩලය තුළ එක් එක් තනතුරුවලට අදාළව නිලධාරීන් 1,810කට වැඩි ප්‍රමාණයක් පුරප්පාඩුව පැවතීම මත රැකියා පීඩනය හා රැකියාවේ අතෘප්තකර බව ඔවුන්ගේ කාර්යසාධනය හා ආයතනයේ කාර්යසාධනය කෙරෙහි බලපා තිබුණි.	මෙම විගණන නිරීක්ෂණය සමග එකඟ වන අතර නිලධාරීන් බඳවා ගැනීම සඳහා ක්‍රියා මාර්ග ලබා ගැනීම තුළින් මෙම තත්වය මග හරවා ගැනීමට කටයුතු කෙරේ.	අදාළ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට පියවරගත යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට අදාළව බඳවාගැනීමේ පටිපාටියේ ඇතුළත් තනතුරු 24ක් සම්බන්ධයෙන් පූර්ණ වශයෙන් පුරප්පාඩු 77ක් සඳහා නිලධාරීන් බඳවාගෙන නොතිබුණි.	බඳවාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් ඇත.	අදාළ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට පියවරගත යුතු ය.
(ඈ)	දෛනිකව බන්ධනාගාරගත වන සිර/සැක ප්‍රමාණය අධිකවීමෙන් 2024 දෙසැම්බර් 31 දිනට එම ප්‍රමාණය 28,278ක් වී තිබුණි. ඒ අනුව රැඳවියන්	බඳවාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් ඇත.	අදාළ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට පියවරගත යුතු ය.

	හා සෘජුව සම්බන්ධ වන ජේලර්, පුනරුත්ථාපන නිලධාරී, සැරයන් හා නියාමක තනතුරුවල පුරප්පාඩු 1,376ක් විය. එය සමස්ථ නිලධාරී පුරප්පාඩු ගණනින් සියයට 76ක් පමණ වේ.		
(ඉ)	2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ තථ්‍ය කාර්ය මණ්ඩලය තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ වෛද්‍ය නිලධාරීන් 17දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.	වෛද්‍ය නිලධාරීන් තනතුරු 82 දක්වා වැඩිකර ගැනීමට (නව තනතුරු 42) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත මු.රෙ. 71 ආකෘතිපත්‍ර යොමුකර ඇත.	කාර්යමණ්ඩලය වර්තමානයට ගැළපෙන ආකාරයට සංශෝධනයකර අනුමතකර ගත යුතු ය.
(ඊ)	බන්ධනාගාර ආයතන අනුව අනුමත හා තථ්‍ය කාර්යමණ්ඩලය පරීක්ෂාවේ දී බන්ධනාගාර ආයතන 25ක නිලධාරීන් අතිරික්තයක් පවතී. ඉන් ප්‍රධාන වශයෙන් බන්ධනාගාර මූලස්ථානයේ නිලධාරීන් 54දෙනෙක්, මාතර බන්ධනාගාරයේ නිලධාරීන් 24දෙනෙක්, බූස්ස බන්ධනාගාරයේ නිලධාරීන් 20දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ආයතන 25ක නිලධාරීන් අනුමත කාර්යමණ්ඩල වාර්තාව අනුව අතිරික්තයක් නිරීක්ෂණය වන නමුත් දැනට භාවිතා කරන කාර්ය මණ්ඩල වාර්තාව 2013 වර්ෂයේ දී අනුමත වූවක් වන බැවින් වර්තමානයේ පවතින නිලධාරී අවශ්‍යතාවයට හා රැඳවියන් ප්‍රමාණයට ප්‍රමාණවත් නොවේ. අනුමත කාර්යමණ්ඩල වාර්තාව සංශෝධනය කිරීම දැඩි අවශ්‍යතාවයක් වන අතර, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීමට නියමිත ය.	කාර්යමණ්ඩලය වර්තමානයට ගැළපෙන ආකාරයට සංශෝධනයකර අනුමතකර ගත යුතු ය.
(උ)	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ තනතුරු සඳහා වූ කාර්යමණ්ඩලය 2013 වර්ෂයේ දී අනුමතකර ඇති අතර, එය එවකට දෙපාර්තමේන්තු නිලධාරී අවශ්‍යතාවය හා රැඳවියන් ප්‍රමාණයට සාපේක්ෂව ප්‍රමාණවත් වුව ද, දෛනිකව අධිකරණය මගින් බන්ධනාගාරගත කරනු ලබන සිර හා සැක ප්‍රමාණය විශාල සංඛ්‍යාවක්වීම මත අනුමත කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවන අතර, එය වර්තමාන අවශ්‍යතාවයන්ට ගැළපෙන ලෙස විශ්ලේෂණය කොට සංශෝධනය කර නොතිබුණි.		කාර්යමණ්ඩලය වර්තමානයට ගැළපෙන ආකාරයට සංශෝධනයකර අනුමතකර ගත යුතු ය.
(ඌ)	සහකාර බන්ධනාගාර අධිකාරී (කාන්තා), සහකාර බන්ධනාගාර අධිකාරී පුනරුත්ථාපන (කාන්තා), උපදේශක නිලධාරී සහ ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර යන තනතුරු සඳහා 2025 මැයි 08 දින වන විටත් අනුමත කළ බඳවාගැනීමේ පටිපාටියක් නොතිබුණි.	සහකාර බන්ධනාගාර අධිකාරී (කාන්තා), සහකාර බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන (කාන්තා) ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ ලැබී ඇති බඳවාගැනීමේ පටිපාටි කෙටුම්පත කඩිනමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමුකර ඇත.	බඳවාගැනීමේ පටිපාටියක් සකස් කර විධිමත් පරිදි අනුමතකර ගත යුතු ය.

(එ)	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ තනතුරු 18ක් සම්බන්ධයෙන් වූ බඳවාගැනීමේ හා උසස්කිරීමේ පටිපාටීන් අනුමත වී වසර 10ක් හෝ ඊට වැඩි කාලයක් ගතව ඇති අතර, ඉන් තනතුරු 15ක් සම්බන්ධයෙන් වූ නව බඳවාගැනීමේ පටිපාටීන් ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ මත අමාත්‍යාංශය වෙත ඉදිරිපත්කර ඇතත්, මෙතෙක් රාජ්‍ය සේවා කොමිෂමේ අනුමැතිය හිමි වී නොතිබුණි.	මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතී.	අදාළ ආයතන සමග සම්බන්ධීකරණය වී බඳවාගැනීමේ හා උසස්කිරීමේ පටිපාටීන් අනුමත කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු ය.
(ඒ)	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික හා මාණ්ඩලික නොවන තනතුරුවල සේවය කරන නිලධාරින්ගේ වාර්ෂික ස්ථානමාරු සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය ඇතුළත් විධිමත් ස්ථාන මාරු පටිපාටියක් සකස්කර නොතිබුණි.	මාණ්ඩලික ස්ථාන මාරු පටිපාටිය-මේ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමග සාකච්ජාවක් 2025 මැයි 26 දින පෙ.ව 10.00ට පැවැත් වූ අතර, ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.	විධිමත් ස්ථානමාරු පටිපාටියක් සකස් කළ යුතු ය.
(ඔ)	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ස්ථිර තනතුරක් වන රියදුරෙකු 2020 ඔක්තෝබර් 22 දින සිට අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙත තාවකාලිකව මුදාහැර තිබුණි. එම නිලධාරියා වෙනුවෙන් 2025 පෙබරවාරි මාසය දක්වා වැටුප්, අතිකාල හා නිලඇඳුම් දීමනා වෙනුවෙන් රු.2,170,590ක මුදලක් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් දරා තිබුණු අතර, නැවත බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත මුදාහැර නොතිබුණි. තව ද, එම වියදම් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය මගින් ප්‍රතිපූර්ණය කිරීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව කටයුතුකර නොතිබුණි.	අධිකරණ අමාත්‍යාංශයේ අවශ්‍යතාවය මත අදාළ නිලධාරින් යොදවා තිබූ අතර, මේ වන විට එම නිලධාරින් නැවත දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.	අමාත්‍යාංශය සමග සාකච්ඡාකර අදාළ නිලධාරින් නැවත දෙපාර්තමේන්තුව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු ය.
(ඕ)	බන්ධනාගාර ආයතනයන්හි කර්මාන්ත අංශවල 2024 දෙසැම්බර් 31 දිනට වෘත්තීය උපදේශක, කර්මාන්ත පරිපාලක, කෘෂි උපදේශක, වැඩ මූලික හා මෝටර් කාර්මික වැනි තනතුරුවල වර්තමානයේ නිලධාරින් 90දෙනෙකු රාජකාරී කරනු ලැබුව ද, එම ආයතනවල අනුමත කාර්යමණ්ඩලය එදිනට 217ක් වීමෙන් නිලධාරින් 127ක ඌණතාවයක් පැවතීම හේතුවෙන් ඉදිකිරීම්, කර්මාන්ත,	මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතී.	කාර්යමණ්ඩලය වර්තමානයට ගැළපෙන ආකාරයට සංශෝධනයකර අනුමතකොට විධිමත් පරිදි බඳවාගැනීමේ කටයුතු කළ යුතු ය.

	වැඩබිම්වල කාර්යක්ෂමතාවය, ව්‍යාපෘතිවල ඵලදායීත්වය හා ගුණාත්මකභාවය පහළ මට්ටමක පැවතුණි. ඉහත තනතුරු දරන නිලධාරීන් වෙනුවට බන්ධනාගාර නියාමක, සැරයන් සහ II පෙළ ජේලර් තනතුරුවල නිලධාරීන් 41දෙනෙකු බන්ධනාගාර ආයතන 12ක කර්මාන්ත අංශයන්ට අදාළ රාජකාරී කටයුතුවල නියැලෙන බව හෙළිදරව් වූ අතර, වර්තමානයේ පවතින නිලධාරී හිඟය තවදුරටත් වර්ධනයවීමට එය හේතුවක් වී තිබුණි. කර්මාන්ත අංශයට සම්බන්ධ එම නිලධාරීන් බඳවාගැනීමට දීර්ඝ කාලයක සිට කටයුතු නොකිරීම තුළින් අනාගතයේ දී බන්ධනාගාර කර්මාන්ත අංශය අක්‍රීය වී සිරකරු ශ්‍රමය ප්‍රයෝජනයටගත නොහැකි තත්ත්වයක් හා විධිමත් පුනරුත්ථාපනයක් සිදුනොවන තත්ත්වයක් පැවතුණි.		
(ක)	දෙපාර්තමේන්තුගත තනතුරු 04කට පමණක් අදාළ වන පුහුණු වැඩසටහන් සඳහා වූ මාර්ගෝපදේශයක් යොදා ගන්නා අතර, දෙපාර්තමේන්තුගත තනතුරු 07ක් සඳහා පුහුණු වැඩසටහන් සම්බන්ධ මාර්ගෝපදේශයන් භාවිතාකර නොතිබුණි. තව ද, එම මාර්ගෝපදේශයන් යාවත්කාලීන කිරීම ආසන්න වසර 07ක් තුළ සිදුකර නොමැති අතර, ඒ සියලුම මාර්ගෝපදේශයන් සඳහා නිත්‍යානුකූල අනුමැතියක් ද නොතිබුණි.	අදාළ මාර්ගෝපදේශයන් යාවත්කාලීනකර නිවැරදිව කටයුතු කරමින් පවතී.	නිලධාරීන් පුහුණු කිරීම සඳහා විධිමත් මාර්ගෝපදේශයක් සකස්කර අනුමත කරගත යුතු ය.
(ග)	සිරකරුවන් කළමනාකරණය කිරීමේ දී හා අනෙකුත් ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මකවීමේ දී බන්ධනාගාර නිලධාරීන්ට ගිනිඅවි පුහුණුව ලබාදීම අත්‍යාවශ්‍ය වුවත්, ඍජුවම සිරකරුවන් සමග සම්බන්ධ වන සහ ගිනිඅවි පුහුණුව ලැබිය යුතු බන්ධනාගාර නිලධාරීන්/ නිලධාරිනියන් 1,171දෙනෙකුට පමණක් 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ කාලය තුළ ගිනිඅවි පුහුණුව ලබාදීම සිදුකර තිබූ අතර, නිලධාරීන් 4,024කට පමණ අදාළ	මේ සම්බන්ධයෙන් සොයාබලා අවශ්‍ය කටයුතු සිදුකිරීමට නියමිත ය.	නිලධාරීන් සඳහා අවශ්‍ය ගිනිඅවි පුහුණුව ලබාදීමට කටයුතු කළ යුතු ය.

	ගිනිඅවි පුහුණුව ලබා දී නොතිබුණි.		
(ජ)	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළව ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ සඳහන් වරදවල් සම්බන්ධව විනය පරීක්ෂණ 142ක් ද 2023 හා 2024 වර්ෂවලට අදාළව එම පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ සඳහන් විනය පරීක්ෂණ 47ක් පැවතුණි.	මේ සම්බන්ධව අවශ්‍ය කටයුතු කිරීමට නියමිත ය.	ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ සඳහන් වරදවල් සම්බන්ධව විනය පරීක්ෂණ පැවැත්වීම, කඩිනම් කිරීම හා විනය නියෝග නිකුත්කිරීම අප්‍රමාදව සිදුකළ යුතු ය.